ගලිගමුව ප්‍රාදේශීය සභාවේ 2022 මුදල් වර්ෂයට අදාළ අයවැය ලේඛනය 2021 නොවැම්බර් මස 09 වැනි දින පැවති මහා සභා රැස්වීමට යෝජනා අංක 2021/09/ඉ-1 යටතේ ඉදිරිපත් කරන ලද අතර, එම අයවැය යෝජනාව වැඩි ඡන්ද 11 කින් සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි. බල ප්‍රදේශයේ ජනතාවගේ පරිශීලනය සඳහා එම සම්මත අයවැය ලේඛනය 2022 ජනවාරි 01 දින සිට පහත සඳහන් ස්ථානවල තැබීමට කටයුතු කරන බව වැඩිදුරටත් නිවේදනය කරමි.

* ප්‍රාදේශීය සභා කාර්යාලය
* බටුවත්ත මහජන පුස්තකාලය
* ගලිගමුව මහජන පුස්තකාලය
* පිටගල්දෙනිය මහජන පුස්තකාලය

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 19 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-95/9

ගලිගමුව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ගාස්තු අයකිරීම

ගලිගමුව ප්‍රාදේශීය සභාව විසින් තීරණය කර පනවා ඇති පහත සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සභාපති සමන් ජයසිංහ වන මා විසින් අය කරනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

සමන් ජයසිංහ,
සභාපති,
ගලිගමුව ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 15 වැනි දින,
ගලිගමුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යන්ත්‍රෝපකරණ කුළියට සැපයීම සඳහා ගාස්තු අය කිරීම

*	**ජල බවුසරය**		*රු. ශත*
	කිලෝමීටර් 10ක් ඇතුළත ජලය සමග ලෝඩ් එකක්		4,500 0
	ජලය රහිතව වරකට බවුසරය		3,000 0
	පැය 8ක් තබා ගන්නේ නම්		5,500 0
	කි.මී. 10ට වැඩිවන 1 කි. මීටරයක් සඳහා (යාම සහ ඒම)		100 0 බැගින්
	පැය 8 කට වැඩි කාලයක් තබා ගන්නේ නම් (ඉහත ගාස්තුවලට අමතරව)		500 0
	බල ප්‍රදේශයෙන් පිටත ජලය සමග ලෝඩ් 01 ක් සඳහා		6,500 0
*	**ගලි බවුසරය**		
	බල ප්‍රදේශය තුළ		
	ගෘහස්ථ ලෝඩ් 01 ක්		4,000 0
	සේවා ගාස්තුව		675 0
	ව්‍යාපාරික ලෝඩ් 01 කට		5,000 0
	සේවා ගාස්තු		675 0
	බල ප්‍රදේශයෙන් පිටත		
	ගෘහස්ථ ලෝඩ් 01 කට		4,500 0
	සේවා ගාස්තුව		2,000 0
	බල ප්‍රදේශයෙන් පිටත යන කිලෝමීටර් 01ක් සඳහා (යාම සහ ඒම)		100 0 බැගින්
	ව්‍යාපාරික ලෝඩ් 01 කට		5,500 0
	සේවා ගාස්තු		2,000 0
	බල ප්‍රදේශයෙන් පිටත යන කිලෝමීටර් 01ක් සඳහා (යාම සහ ඒම)		100 0 බැගින්
*	**මාර්ග තලනය**		
	දිනකට (ඉන්ධන රහිතව)		4,000 0
*	**ZA 5575 දරන බැකෝ යන්ත්‍රය**		
	මීටර් පැය 01 ට		2,500 0
	(පැය 2ක මුදල එකවර ගෙවිය යුතුය. යාම සහ ඒමද මීටර් පැයවලට ඇතුළත් වේ.)		
*	**ZA 5408 දරන මෝටර් ග්‍රේඩරය**		
	මීටර් පැය 01 ට		3,500 0
	(යාමට ඒමට ගාස්තු අය කෙරේ)		
*	පුටු 01	දිනක් සඳහා	5 0
*	කොඩි කණු 01	දිනක් සඳහා	25 0
*	පාලම් කොඩි 01	දිනක් සඳහා	10 0
*	වෙනත් කොඩි 01	දිනක් සඳහා	5 0
*	ටකරන් තහඩු 01	දිනක් සඳහා	10 0
*	සාස්පාන්/තාච්චි 01	දිනක් සඳහා	100 0
*	නව වේදිකාව	එක් දිනක් සඳහා	1,000 0
*	නව වේදිකාව	තැන්පත්	3,000 0
*	**ජල ගාස්තු අය කිරීම**		

	රු. ශත
ගෘහ	
ස්ථාවර ගාස්තුව	75 0
ඒකක	
1-10	4 0
11-20	10 0
21-30	20 0
31-50	30 0
51 සිට	50 0
ව්‍යාපාර	
ස්ථාවර ගාස්තු	150 0
එක් ඒකකයක් සඳහා	40 0
* ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අය කිරීම විස්තරය	වර්ග අඩි 01ට මිල
බැනරයක් මගින් ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය	30 0
කටවුට්	45 0
ස්ථිර පුවරුවක ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම	90 0

* **2022 වර්ෂය සඳහා අයදුම්පත්/සහතික නිකුත් කිරීම සඳහා ගාස්තු අය කිරීම**

අනු. අංකය	*අයදුම්පත් වර්ගය*	*2022 වර්ෂයට ගාස්තුව රු. ශත*
1.	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	960 0
2.	වීථි රේඛා හා නොපවරා ගැනීමේ සහතික නිකුත් කිරීමේ ගාස්තු	650 0
3.	අනතුරුදායක කොස් ගස් සඳහා අයදුම්පත්‍ර ගාස්තු	750 0
4.	අනතුරුදායක ගස් (අනෙකුත් සියලුම) සඳහා අයදුම්පත්‍ර ගාස්තු	500 0
5.	පරිසර බලපත්‍ර නිකුත් කිරීමේ ගාස්තු	4,000 0
6.	පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තු	120 0
7.	කොම්පෝස්ට් පොහොර කිලෝ 01ක්	15 0
8.	ආදාහනාගාර සේවාව පවත්වාගෙන යාම වෙනුවෙන් ගාස්තු	
	බල ප්‍රදේශය තුළ පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	6,500 0
	බල ප්‍රදේශයෙන් පිටත පදිංචි අයකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම	7,500 0
	ගලිගමුව ප්‍රාදේශීය සභාවේ සේවය කරන හෝ කරන ලද කාර්ය මණ්ඩලයේ යම් තැනැත්තකුගේ හෝ මහජන නියෝජිතයෙකුගේ ආදාහනය වෙනුවෙන් (ව්‍යවස්ථාව මත)	නොමිලේ
9.	පිඹුරු සැලැස්ම අනුමත කිරීම (පර්චස් ප්‍රමාණය අනුව)	
	1. පර්චස් 6-20 දක්වා	500 0
	2. පර්චස් 21-30 දක්වා	700 0
	3. පර්චස් 31-50	1,000 0
	4. පර්චස් 51ට වැඩි සියලුම පිඹුරුපත් සඳහා	1,500 0
*	නාගරික සංවර්ධන අධිකාරියට අයත් ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තු	110 0
*	නිවාස හා නගර සංවර්ධන ආඥාපනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක පිඹුරුපත් අනුමත කිරීමේ පෝරම ගාස්තුව	110 0
10.	වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීමේ පෝරම ගාස්තු	200 0

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල හා ගෙපත්වල 2020 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2021 වර්ෂය සඳහා පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, ඉහත කී වාර්ෂික වටිනාකමින් 6%ක වරිපනමක් 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු බවත්, 2021 වර්ෂය සඳහා එක් එක් කාර්තුව වෙනුවෙන් මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30 හා දෙසැම්බර් මස 31 යන දිනයන්ට පෙර වාර්ෂික වරිපනම් බද්ද මැදගම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවත්, එම වාර්ෂික වරිපනම් බද්ද 2021 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, කාර්තුවේ මුල් මස අවසන් දින හෝ ඊට පෙර අදාළ වරිපනම් මුදල මැදගම ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාළ මුදලින් සියයට පහක (5%) වට්ටමක් ද ලබාදිය යුතු බවත් යෝජනා කරමි.

12 - 93/1

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වැනි වගන්තියයෙන් මැදගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු 147 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ එකී පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයෙහි I වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2022 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතුයැයි යෝජනා කරමි.

උපලේඛනය

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	බේකරිය	500 0	750 0	1,000 0
02.	කොන්ඩා කපන ස්ථාන සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
03.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04.	මස් විකිණීම	500 0	750 0	1,000 0
05.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
06.	අවමංගල්‍ය සේවා සැපයීම	500 0	750 0	1,000 0
07.	බත්කඩ ආපනශාලා සහ තේ හෝ කෝපි	500 0	750 0	1,000 0
08.	සිසිල්බීම කර්මාන්තශාලා	500 0	750 0	1,000 0
09.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
10.	ඖතක මඩු	500 0	750 0	1,000 0
11.	සංචාරක වෙළෙඳාම	500 0	750 0	1,000 0
පීඩාකාරී ව්‍යාපාර :				
12.	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
13.	සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
14.	උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50ට වඩා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
15.	රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම	500 0	750 0	1,000 0
16.	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
17.	තොග වශයෙන් විකිණීම සඳහා නරක්වනසුළු කෑම වර්ග හෝ ආහාර වර්ග තබා ගැනීම	500 0	750 0	1,000 0
18.	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
19.	කරවල මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
20.	මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
21.	පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
22.	දුම්කොළ වියලීම	500 0	750 0	1,000 0
23.	සත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
24.	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
25.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
26.	සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
27.	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
28.	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
29.	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
30.	වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
31.	සිරප් හෝ පලතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0

		I වැනි තීරුව	*II වැනි තීරුව*	
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
32.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
33.	පොල් ලෙලි නිපදවීම (පල් කිරීම)	500 0	750 0	1,000 0
34.	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
35.	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
36.	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
37.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
38.	දූව ඉරීම	500 0	750 0	1,000 0
39.	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
40.	සම්භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
41.	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
42.	ඉටිපන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
43.	ටයර්, ටියුබ් වොල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
44.	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටස් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
45.	ගඩොල් පිළිස්සීම	500 0	750 0	1,000 0
46.	උළු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
47.	පොහොර, හුණු, පිටි හෝ වෙනත් ද්‍රව්‍යයක් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
48.	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
49.	නිමි ඇඳුම් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
50.	කුකුළු වෙළෙඳසලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
51.	ටයර්, ටියුබ් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
52.	සපත්තු/බෑග්/සම් භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
53.	දුම්කොළ යොදා කරන සිගරට්, බීඩි, සුරුට්ට් නිපදවීම	500 0	750 0	1,000 0
54.	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
55.	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
	අන්තරායදායක ව්‍යාපාර :			
56.	අයිස් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
57.	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
58.	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
59.	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය	500 0	750 0	1,000 0
60.	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ වෙළඳ සැලක් සඳහා	500 0	750 0	1,000 0
61.	යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
62.	හිස්ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
63.	පා පැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
64.	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව	*II වැනි තීරුව*		
	බලය දෙනු ලබන කාර්යය	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
65.	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
66.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, ගබඩා කිරීම	500 0	750 0	1,000 0
67.	ලෝහ සංස්කාරක කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
68.	වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
69.	කළුගල් තැනීම හෝ කැඩීම	500 0	750 0	1,000 0
70.	සිසිල් බීම නිෂ්පාදනය	500 0	750 0	1,000 0
පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර :				
71.	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0
72.	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤ, නිපදවීම	500 0	750 0	1,000 0
73.	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
74.	ලෝහ වර්ග පෑස්සීම	500 0	750 0	1,000 0
75.	මෝටර් වාහන අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
76.	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
77.	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
78.	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
79.	මෝටර් වාහන බොඩි තැනීම	500 0	750 0	1,000 0
80.	යකඩ තහඩු ගැල්වනයිස් කිරීම	500 0	750 0	1,000 0
81.	ජී අයි බාල්දි නිපදවීම	500 0	750 0	1,000 0
82.	වායුසමීකරණ යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
83.	යන්ත්‍රෝපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
84.	විදුලි භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
85.	රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම	500 0	750 0	1,000 0
86.	සංචායන බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
87.	ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම	500 0	750 0	1,000 0
88.	වියළි කෝෂ බැටරි නිපදවීම	500 0	750 0	1,000 0
89.	වී මෝල්	500 0	750 0	1,000 0
90.	දුරකතන නිපදවීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
91.	විද්‍යුත් උපකරණ අළුත්වැඩියාව හෝ එක්ලස් කිරීම	500 0	750 0	1,000 0
92.	පරිගණක හෝ තොරතුරු තාක්ෂණ උකකරණ එකලස් කිරීම හෝ අළුත්වැඩියාව	500 0	750 0	1,000 0
93.	ඩ්‍රයික්ලීන් කිරීම	500 0	750 0	1,000 0
94.	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර එම බදු මුදල මැදගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
01.	උක් මෝල	500 0	750 0	1,000 0
02.	මැටි භාණ්ඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
03.	යකඩ කම්මලක්	500 0	750 0	1,000 0
04.	ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05.	කුෂන් වැඩපල	500 0	750 0	1,000 0
06.	බිම්මල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
07.	කිරි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
08.	එළවළු වර්ග වියළා පැකට් කිරීම හා අලෙවිය	500 0	750 0	1,000 0
09.	හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂය තුළදී පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එකී II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර මැදගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව *2021 වර්ෂයේදී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *ගෙවිය යුතු බද්ද* *රු. ශත*
රු. 6000 නොඉක්මවන අවස්ථාවක	නැත
රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට	90 0
රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට	180 0
රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට	360 0
රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට	1,200 0
රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 93/4

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාලව වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වගන්තිය හා හතරවන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු II වැනි තීරුවේ අනුරූපිත සටහනෙහි නිරූපිත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරය		*II වැනි තීරය*
		රු. ශත
(1)	(i) මෝටර් රථයක්, මෝටර් ට්‍රයිකාරයක්, මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා	25 0
	(ii) සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා	
	(අ) වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්	18 0
	(ආ) වෙළෙඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම්	4 0
	(iii) සෑම කරත්තයක් සඳහා	20 0
	(iv) සෑම අත් කරත්තයක් සඳහා	10 0
	(v) සෑම රික්ෂෝවක් සඳහා	7 50
	(vi) සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා	15 0
	(vii) සෑම ඇතෙකු සඳහා	50 0

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, වීල්බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන අත් කරත්ත සහ වෙළෙඳ කාර්ය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

12 - 93/5

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ක්‍රීඩා පිටිය කුළියට දීමේ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ උඟව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩාපිටි අතුරු ව්‍යවස්ථාවේ 04 වන වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජූනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ක්‍රීඩාපිටි අතුරු ව්‍යවස්ථාවේ 04 වැනි වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයෙන් සඳහන් ගාස්තුවක් 2021 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

මැදගම පොදු ක්‍රීඩාපිටිය (දිනකට)	*රු. ශත*
සැණකෙළි/සංදර්ශන හා ආදායම් උපයන කටයුතු සඳහා	10,000 0
ඒ වෙනුවෙන් ඇප තැන්පත් මුදල	5,000 0
රැස්වීමක් පැවැත්වීමට	2,000 0
වෙනත් කටයුතු සඳහා	2,000 0
ඒ වෙනුවෙන් ඇප තැන්පත් මුදල	2,500 0
ඉහත සියලු කටයුතු වෙනුවෙන්	
විදුලිය සඳහා දිනකට	2,000 0
ජලය සඳහා දිනකට	1,000 0

12 - 93/6

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා සම්මන්ත්‍රණ ශාලාව කුළියට දීමේ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජූනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ සම්මන්ත්‍රණ ශාලාව පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 3 (ආ) වන වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාවටට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔකතෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ සම්මන්ත්‍රණ ශාලාව අතුරු ව්‍යවස්ථාවේ 3 (ආ) වන වගන්තියෙන් මැදගම ප්‍රාදේශීය සභාවටට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

මැදගම සම්මන්ත්‍රණ ශාලාව (දිනකට)	*රු. ශත*
සැණකෙළි/සංදර්ශන හා ආදායම් උපයන කටයුතු සඳහා	6,000 0
ඒ සඳහා ඇප තැන්පත් මුදල	10,000 0
රැස්වීමක් /අධ්‍යාපන කටයුත්තක් පැවැත්වීම	1,000 0
වෙනත් කටයුතු සඳහා	2,000 0
ඒ සඳහා ඇප තැන්පත් මුදල	2,500 0
ඉහත සියලු කටයුතු වෙනුවෙන්	
විදුලිය සඳහා දිනකට	1,000 0
ජලය සඳහා දිනකට	500 0

12 - 93/7

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වාහන, යන්ත්‍ර සූත්‍ර හා දේපළ කුලියට දීමේ ගාස්තු පැනවීම

මැදගම ප්‍රාදේශීය සභාව විසින් 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

මැදගම ප්‍රාදේශීය සභාව සතු වාහන, හා යන්ත්‍ර සූත්‍ර 2022 වර්ෂය සඳහා කුලියට දීමේදී මෙහි පහත සඳහන් කර ඇති පරිදි වාහන හා යන්ත්‍ර සූත්‍ර ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු අයකළ යුතුයැයි යෝජනා කරමි.

		රු. ශත
➢ බැකෝ ලෝඩර් යන්ත්‍රය පැයකට	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	2,900 0
➢ මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය පැයකට	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	3,200 0
➢ කියුබ් 02 ටිපර් රථ දිනකට	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	10,000 0
➢ කියුබ් 2.5 ටිපර් රථ දිනකට	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	12,000 0
ටොන් 10 ගල්රෝල පැයකට	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	4,200 0
ලීටර් 3500 ජල බවුසර්	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	1,500 0
(ජල බවුසර් පළමු කි.මී. 03 සඳහා ඉහත ගාස්තුව ද ඊට වැඩි වන සෑම කි.මී. 01ක් සඳහාම රු. 50 0 බැගින් අය කිරීම)		
ලීටර් 6000 ජල බවුසර්	(ක්‍රියාකරු සහ ඉන්ධන සහිතව)	3 00 0
(ජල බවුසර් පළමු කි.මී. 03 සඳහා ඉහත ගාස්තුවද ඊට වැඩිවන සෑම කි.මී. 01ක් සඳහාම රු. 75 0 බැගින් අය කිරීම.)		

මෘත ශරීර ප්‍රවාහනය කිරීමේ රථය සඳහා ගාස්තු අයකිරීම :

	රු. ශත
පළමු කිලෝමීටර් 05 සඳහා	1,500 0
කි.මී. 06 සිට කි.මී. 10 දක්වා	2,000 0
කි.මී. 11 සිට කි.මී. 20 දක්වා	2500 0
කි.මී. 21 සිට කි.මී. 30 දක්වා	3,000 0

කිලෝමීටර් 30ට වඩා වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම රු. 30 0 බැගින් අයකරනු ලැබේ. (කිලෝමීටර් ගණන ලෙස ආදාහනාගාරයෙන් ගමන් ආරම්භ කළ අවස්ථාවේ සිට නැවත ආදාහනාගාරයට පැමිණීම දක්වා වූ කිලෝමීටර් ගණන වේ.)

බස් නැවතුම් පොළ භූමිය, පොළ භූමිය ඇතුළුව නගරයේ ඕනෑම ස්ථානයක් කුලියට දීම

	රු. ශත
දිනකට කුලියට දීම සඳහා	6,000 0
වරුවකට හෝ ඉන් කොටසකට	3,000 0

12 - 93/8

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ජල ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

මැදගම ප්‍රාදේශීය සභාවට අයත් ජල සම්පාදන යෝජනා ක්‍රමය මගින්, සපයනු ලබන ජලය සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

ඒකක	*මිල*
01 - 05	ඒකකයට රු. 6 0 බැගින්
06 - 10	ඒකකයට රු. 10 0 බැගින්
11 - 15	ඒකකයට රු. 14 0 බැගින්
16 - 20	ඒකකයට රු. 24 0 බැගින්
21 - 25	ඒකකයට රු. 29 0 බැගින්
26 - 30	ඒකකයට රු. 39 0 බැගින්
31 ට වැඩි	ඒකකයට රු. 54 0 බැගින්

* ජල බිල්පත් ගාස්තුවට අමතරව මාසිකව රු. 50 ක ස්ථාවර ගාස්තුවක් අය කෙරේ.

* ප්‍රජාමූල සංවිධානය සඳහා ජලය ලබාදීමේ දී ජල ඒකකයකට රු. 10 බැගින් ද, මාසික ස්ථාවර ගාස්තුව වශයෙන් රු. 500 ක් ද අය කෙරේ.

12 - 93/9

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව අයාලේ යන සතුන් අල්ලා ගැනීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 වැනි වගන්තියේ 2 වන උපවගන්තියෙන් පැවැරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 66 වගන්තියේ 2 වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවැරී ඇති බලතල ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලුම පොදු මාර්ගවල හෝ පොදු ස්ථානයක හෝ ඒ අවට බැඳ දිගේලි කර හෝ අයාලේ යන හෝ ගවයින්, මී ගවයින්, එළුවන් ආදී සතුන් ඇල්ලීමටත් එසේ අල්ලා ගනු ලබන සතුන් ගාල් කිරීමටත්, එසේ ගාල් කරනු ලබන සතුන් නිදහස් කිරීම සඳහාත් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට සහ අයාලේ යන සතුන් අල්ලා දින 10 ක් ඇතුළත අයිතිකරුවන් තම සතුන් නිදහස් කර නොගතහොත් එම කාලයට පසුව එකී සතුන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා අදාළ ගාස්තු සහ වෙන්දේසි කිරීමේ වියදම් එමගින් අය කිරීමටත්, යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
ගවයින් හෝ මී ගවයින් ඇල්ලීමට (එක් සතකුට)	2,000 0
එළුවන් ඇල්ලීමේ ගාස්තුව (එක් සතකුට)	1,000 0
ගවයින් හෝ මී ගවයින් ආරක්ෂා කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට)	300 0
එළුවන් ආරක්ෂා කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් සතෙකුට)	200 0
ගවයින් හෝ මී ගවයින් නඩත්තු කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් ගවයකුට)	150 0
එළුවන් නඩත්තු කිරීමේ ගාස්තුව (එක් දිනකට එක් එළුවෙකුට)	150 0

12 - 93/10

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 17 වන අතුරු ව්‍යවස්ථාවේ 10 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 17 වන අතුරු ව්‍යවස්ථාවේ 10 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීමට හෝ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් පහත උපලේඛනයෙන් සඳහන් ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු අංකය	*ප්‍රවරුවේ ස්වභාවය*	*වර්ග අඩි ප්‍රමාණය*	*ගාස්තුව රුපියල්*		
			මාස 03ට අඩු	*මාස 03 හෝ 06 අතර*	*වසරක්*
01.	කිසියම් බිත්තියක් හෝ තාප්පයක ප්‍රචාරක කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	02ත් 10ත් අතර	25 0	50 0	75 0
		10ට වැඩි	25 0	50 0	100 0
02.	රෙදි, ඩිජිටල් බැනර් සඳහා	02ත් 10ත් අතර	30 0	35 0	50 0
		10ට වැඩි	40 0	45 0	100 0
03.	තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02ත් 10ත් අතර	50 0	75 0	100 0
		10ට වැඩි	50 0	75 0	100 0
04.	විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා	02ත් 10ත් අතර	50 0	75 0	100 0
		10ට වැඩි	50 0	75 0	200 0
05.	ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම්	02ත් 10ත් අතර	20 0	25 0	30 0
		10ට වැඩි	30 0	35 0	40 0

12 - 93/11

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කොටබෝව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැරට අදාළව වෙළෙඳ බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

කොටබෝව කුඩා කතරගම දේවාලයේ ඇසල පෙරහැර කාල සීමාව තුළ උත්සව භූමියේ තාවකාලිකව පවත්වාගෙන යනු ලබන වෙළෙඳසැල්වලින් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*අයිතමය*	*මුදල රු. ශත*
01.	කාවාඩි පොල	2,000 0
02.	සර්කස් සංදර්ශනය	2,000 0

අනු. අංකය	අයිතමය	මුදල රු. ශත
03.	කතුරු ඔන්විල්ලා	2,000 0
04.	මාරක ළිඳ	2,000 0
05.	ලොතරැයි කුටි/වාහන	2,000 0
06.	මෙරිගෝ රවුන්	2,000 0
07.	පිත්තල භාණ්ඩ	2,000 0
08.	අයිස් ක්‍රීම් කුටි/ලොරි	1,500 0
09.	අයිස් ක්‍රීම් ත්‍රීවිල් රථය	1,000 0
10.	අයිස් ක්‍රීම් යතුරු පැදිය	500 0
11.	මැජික් සංදර්ශන	2,000 0
12.	සැන්ඩෝ දර්ශන	2,000 0
13.	සිසිල් බීමහල්	750 0
14.	පරිගණක ආශ්‍රිත කටයුතු	1,000 0
15.	විනෝද ක්‍රීඩා	1,000 0
16.	කම්හල් භාණ්ඩ විකිණීම	1,000 0
17.	විසිතුරු බඩු	1,000 0
18.	බුලත්විට	250 0
19.	බයිට් වර්ග අලෙවිය	1,000 0
20.	සෙල්ලම් බඩු	1,000 0
21.	පිළිම වර්ග	1,000 0
22.	බෑග් හා සම් භාණ්ඩ	2,000 0
23.	ඇළුමිනියම් භාණ්ඩ	2,000 0
24.	ප්ලාස්ටික් භාණ්ඩ	2,000 0
25.	පූජා වට්ටි	2,000 0
26.	ආපන ශාලා	1,000 0
27.	රට කජු	200 0
28.	රෙදි වර්ග හා නිමි ඇඳුම්	3,000 0
29.	විසිතුරු සතුන්	1,000 0
30.	තොප්පි වර්ග අලෙවිය	750 0
31.	සිම් කාඩ් වර්ග අලෙවිය	1,500 0
32.	වීදුරු භාණ්ඩ අලෙවිය	1,000 0
33.	මැටි භාණ්ඩ අලෙවිය	1,000 0
34.	බඩ ඉරිඟු	300 0
35.	තේ පැන් ශාලා	1,000 0
36.	පොත් වර්ග අලෙවිය	500 0
37.	ජංගම දුරකතන අලෙවිය	2,000 0
38.	පාවහන් අලෙවිය	1,500 0
39.	කෘෂිකාර්මික පැළ වර්ග	1,000 0
40.	පින්තූර වර්ග	1,000 0
41.	විදුලි උපකරණ	2 00 0
42.	වේවැල් ආශ්‍රිත නිෂ්පාදන	1,500 0
43.	විසිතුරු මල් වර්ග	1,000 0
44.	පලතුරු වර්ග	1,000 0
45.	රස කැවිලි	1,500 0
46.	ටොයිස්	1,000 0
47.	ජංගම වෙළෙඳුන් සඳහා	500 0

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ගලඔය ගිමන්හලෙහි රථ වාහන නවතා තැබීමේ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

මැදගම ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ගලඔය ගිමන්හලේ නවාතැන් ගන්නා පුද්ගලයින්ගේ රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	වාහන වර්ගය	*දිවා කාලය* *රු. ශත*	*රාත්‍රී කාලය* *රු. ශත*
1.	බස් රථය (දොර දෙක)	1,500 0	3,000 0
2.	බස් රථය (තනි දොර)	1,000 0	2,500 0
3.	වෑන් රථය	500 0	1,500 0
4.	කැබ් රථය	300 0	1,000 0
5.	ලොරි රථය	300 0	1,000 0
6.	ත්‍රිරෝද රථය	200 0	500 0
7.	යතුරු පැදිය	100 0	250 0

12 - 93/13

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව මෘත ශරීර ආදාහනය කිරීමේ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උෂව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාවේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ, පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ආදාහනාගාර අතුරු ව්‍යවස්ථාවේ 7 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෘත ශරීරයක් ආදාහනාගාරයේ ආදාහනය කිරීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකර කිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අ. අංකය	*කාරණය*	*අයකරන ගාස්තු*
		රු. ශත
01.	පූජ්‍ය පක්ෂයේ ආදාහන කටයුත්තක් වෙනුවෙන්	6,500 0
02.	ප්‍රදේශයේ පදිංචි මහජන නියෝජිතයෙකුගේ ආදාහනයක් සඳහා	7,000 0
03.	ආබාධිත රණවිරුවෙකුගේ ආදාහනයක් සඳහා	7,500 0
04.	මුල් පත්වීමේ සිට විශ්‍රාම යන තෙක් මැදගම ප්‍රාදේශීය සභාවේ සේවය කළ මහතෙකුගේ හෝ මහත්මියකගේ ආදාහනයක් සඳහා	7,000 0
05.	මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම් ලාභීන්ගේ ආදාහන කටයුත්තක් සඳහා	7,000 0
06.	සෙසු අය සඳහා	8,000 0

භෂ්මාවශේෂ තැන්පත් කිරීම :

01.	ආදාහනාගාර භූමියේ මල්බඳුනක් තුළ තැන්පත් කිරීම සඳහා	3,000 0
02.	එම මල්බඳුනේම පවුලේ අයෙකුගේ භෂ්මාවශේෂ තැන්පත් කිරීම	1,500 0
03.	ඉදිරිපස සුසාන භූමියේ (අඩි 1 1/2 x 1 1/2) වලක තැන්පත් කිරීම සඳහා (බල ප්‍රදේශය තුළ අය සඳහා)	500 0
04.	ඉදිරිපස සුසාන භූමියේ (අඩි 1 1/2 x 1 1/2) වලක තැන්පත් කිරීම සඳහා (බල ප්‍රදේශයෙන් පිට අය සඳහා)	1,000 0

12 - 93/14

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට අදාළව අවසර පත්‍ර ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 07 වන අතුරු ව්‍යවස්ථාවේ 06 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ නොවැම්බර් මස 01 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 07 වන අතුරු ව්‍යවස්ථාවේ 06 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා සීමාව තුළ ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග යන්හි වාහන ධාවනය සඳහා පහත උපලේඛනයෙන් සඳහන් පරිදි අවසර පත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

	රු. ශත
වැලි හෝ ග්‍රැවල්, පස්, ගල් කියුබ් 01ක් ප්‍රවාහනය සඳහා	200 0
ග්‍රැවල්, පස්, ගල් ප්‍රවාහනය සඳහා මසකට (කියුබ් ප්‍රමාණය සඳහන් නොකළ අවස්ථාවක)	10,000 0
දූව ප්‍රවාහන සඳහා (කියුබික් අඩි 100ට නොවැඩි ප්‍රමාණයක් එකවරක දී ප්‍රවාහනය කළ යුතුය)	5,000 0

12 - 93/15

මැදගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා පෙරසැරි කිරීමේ ගාස්තු පැනවීම

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ ගොඩනැගිලි තැනීම හා වැඩ කටයුතු අතුරු ව්‍යවස්ථාවේ 16 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 28 වැනි දින පවත්වන ලද මැදගම ප්‍රාදේශීය සභා රැස්වීමේදී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

රංජිත් පියදිගම,
සභාපති,
මැදගම ප්‍රාදේශීය සභාව.

2021 ක් වූ ඔක්තෝබර් මස 22 වැනි දින,
මැදගම ප්‍රාදේශීය සභාව,
මැදගම.

යෝජනාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව 2013 ජුනි මස 28 වැනි දින අංක 1816/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඌව පළාතේ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති 2013 දෙසැම්බර් මස 27 වැනි දින අංක 1843 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මගින් සභාව පිළිගෙන ක්‍රියාත්මක කරන සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ II වැනි කොටසේ ගොඩනැගිලි තැනීම හා වැඩ කටයුතු අතුරු ව්‍යවස්ථාවේ 16 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මැදගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩම් කොටස් කිරීම, අලුතින් තාප්ප ඉදිකිරීම, අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, පවත්නා ගොඩනැගිලි අලුත්වැඩියාව සහ අනුකූලතා සහතික නිකුත් කිරීම වැනි කාර්යයන්හි දී පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමට යෝජනා කරමි.

ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා පෙරසැරි ගාස්තු අය කිරීම හා නිසි බලපත්‍රයකින් තොරව ඉදිරිපත් කරන ලද ඉදි කිරීම සඳහා ආවරණ අනුමැතිය ලබාදීමේ ගාස්තු අයකිරීම

රු. ශත

01. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව	250 0
02. ඉඩම් අනු කොටස් කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව	250 0
03. වීථිරේඛා සහතිකයක් සඳහා ගාස්තුව	900 0
04. වීථිරේඛා ඉල්ලුම් පත් ගාස්තුව	100 0

සංවර්ධන කාර්යයේ ස්වභාවය	*අයකළ යුතු ගාස්තු*		
i. සංවර්ධන අවසර පත්‍ර නිකුත් කිරීම	පෙරසැරි ගාස්තු		
i. ඉඩම් අනු කොටස් බෙදීම මාර්ග කාණු හා පොදු බිම් කොටස්	i. බිම් කට්ටි ප්‍රමාණය		එක් බිම් කට්ටියකට අයකළ යුතු මුදල රු. ශත
	* ව.මී. 150-300 අතර		375 0
	* ව.මී. 301-600 අතර		300 0
	* ව.මී. 601-900 අතර		225 0
	* ව.මී. 900 වැඩි		150 0
ii. ගොඩනැගිලි ඉදි කිරීම්/ පවත්නා ගොඩනැගිලිවලට අළුතින් කොටස් එකතු කිරීම නැවත ඉදිකිරීම්	ii. ගෙබිම් විශාලත්වය	පදිංචිය සඳහා රු. ශත	වාණිජ හෝ වෙනත් රු. ශත
	45ට අඩු	375 0	750 0
	45-90	1,125 0	1,500 0
	91-180	1,875 0	2,250 0
	181-270	2,625 0	3,000 0
	271-450	3,375 0	4,500 0
	451-675	4,125 0	6,000 0
	676-900	6,375 0	7,500 0
	901-1,225	5,625 0	9,000 0
	ව.මී. 1,226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 750 බැගින්		ව.මී. 1,226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 900 බැගින්

මායිම් තාප්ප/ආරක්ෂක බැමි ඉදිකිරීම	නේවාසික දික් මීටර් 1ක් සඳහා ගාස්තුව	වාණිජ හා වෙනත් වර්ග දික් මීටර් 1 සඳහා
ගොඩනැගිලි සීමාවෙන් පිට	රු. 225 0	රු. 300 0
ගොඩනැගිලි සීමාව තුළ කුඹුරු	රු. 375 0 ව.මී. 150ට අඩු රු. 1,125 0ක් සහ එයට වැඩි සෑම ව.මී. 150කට රු. 750 0 බැගින්	රු. 450 0
දුරකථන	උස මීටර් 1ක් සඳහා රු. 2,000 0 බැගින්	
විශේෂ ව්‍යාපෘති	රුපියල් මිලියන 5කට රු. 3,750 0 සහ වැඩිවන සෑම රුපියල් මිලියන එකකට රු. 100 0 බැගින්	
	පෙරසැරි ගාස්තු ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)	රු. ශත
නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම	45ට අඩු 45-90 91-180 181-270 271-450 451-675 676-900	375 0 750 0 900 0 1,125 0 1,312 0 1,500 0 1,687 0 වර්ග මීටර් 901ට වැඩිවන වර්ග මීටර් 90 ක් සඳහා රු. 500 0 බැගින්
මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය	පෙරසැරි ගාස්තු	
iii. ඉඩම් අනු බෙදීම්	● වර්ග මීටර් 1,000ට අඩු ඉඩම් සඳහා රු. 1,500 0 ● වර්ග මීටර් 1,001-5,000 දක්වා රු. 1,250 0 ● වර්ග මීටර් 5,001-10,000 දක්වා රු. 7,500 0 ● 10,000 සිට වැඩිවන සෑම වර්ග මීටර් 1,000 කටම රු. .750 0 බැගින්	
iv. ඉඩම් කුඹුරු	● ව.මී. 150ට අඩු ඉඩම් සඳහා රු. 1,875 0 ● ව.මී. 151 සිට 300 දක්වා රු. 3,750 0 ● ව.මී. 301 ට වැඩිවන සෑම ව.මී. 150 කටම රු. 2,250 0	
v. විශේෂ ව්‍යාපෘති	● කුඩා පරිමාණ රු. මිලියන 5ට අඩුවන ව්‍යාපෘති - රු. 7,500 0 ● මධ්‍යම පරිමාණ රු. මිලියන 5-50 අතර ව්‍යාපෘති - රු. 37,500 0 ● මහා පරිමාණ රුපියල් මිලියන 50ට වැඩි ව්‍යාපෘති රු. 112,500 0	

4. අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්/සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතික ලබාගත යුතුයි) i. ඉඩම් අනු බෙදීම්	අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තුව පළමු බිම් කොටසකට රු. 750 0ක් සහ ඊට වැඩිවන සෑම බිම් කට්ටියකටම රු. 375 0 බැගින	
ii. නේවාසික ඉදිකිරීම	ව.මී. 300ට අඩු රු. 2,250 0 සහ ඊට වැඩිවන සෑම ව.මී. 1කට රු. 10 0 බැගින්	
වාණිජ හා වෙනත් ඉදි කිරීම්	ව.මී. 100ට අඩු රු. 2,250 0 ක් සහ ඊට වැඩිවන සෑම ව.මී. 1කට රු. 20 0 බැගින්	
iii. මායිම් තාප්ප/ආරක්ෂක බැම් ඉදිකිරීම්	පළමු දික් මීටර් 100 සඳහා රු. 750 0 ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 10 0 බැගින්	
iv. ඉඩම් කුඹුරු ගොඩ කිරීම්	ව.මී. 150ට අඩු රු. 2,250 0ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 20 0 බැගින්	
v. දුරකථන/විදුලි සංදේශ කුළුණු	උස මීටර් 5 සිට 20 දක්වා රු. 1,500 0ක් සහ ඊට වැඩිවන සෑම මීටර් 1කටම රු. 100 0 බැගින්	
vi. විශේෂ ව්‍යාපෘති	කුඩා පරිමාණ සඳහා රු. 3,750 0 මධ්‍යම පරිමාණ සඳහා රු. 7,500 0 මහා පරිමාණ සඳහා රු. 15,000 0	
	ආවරණ අනුමැතිය දීම සඳහා ගාස්තු එක් එක් බිම් කොටස සඳහා රු. 750 0ක ගාස්තුවක්	
/ නිසි බලපත්‍රයක් නොමැතිව ඉඩම් අනු බෙදීම් කිරීම		
නිසි සංවර්ධන බල පත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීම්/කොටස් එකතු කිරීම්/නැවත ඉදිකිරීම්	නේවාසික වර්ග මීටර් 1ක් සඳහා ගාස්තු	වාණිජ හා වෙනත් ව.මී. 1ක් සඳහා ගාස්තු
අත්තිවාරම් පමණක් (කයිරු මට්ටම) සම්පූර්ණකොට ඇති විට	රු. 150 0	රු. 375 0
වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇතිවිට	රු. 225 0	රු. 750 0
වහලය ඇතළුව ඉදිකොට ඇතිවිට	රු. 300 0	රු. 1,125 0
සම්පූර්ණයෙන් ඉදි කොට ඇතිවිට	රු. 498 0	රු, 1,150 0
මායිම් තාප්ප/ආරක්ෂිත බැම්ම ඉදිකිරීම	රු. 300 0	රු. 300 0
ඉඩම්/කුඹුරු ගොඩ කිරීම සඳහා	සෑම මී. 150 කට රු. 3,750 0 බැගින්	

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

වරිපනම් බදු පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 සහ 146 වගන්ති යටතේ (1) වැනි උපවගන්තියෙන් නුවරඑළිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පවත්වන ලද නුවරඑළිය ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව තීරණ අංක 05.01.03 යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

වරිපනම් බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයෙහි සඳහන් දියුණු කළ ප්‍රදේශ යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා තක්සේරුව/සත්‍යෝක්ෂණය ලෙස සම්මත කළ යුතු බවටත්, එකී දේපළ මත ඉහත කී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත ඉහත කී තක්සේරුව සඳහා වාර්ෂික වටිනාකමින් සියයට පහලොවක් (15%) වාර්ෂික බද්දක් අය කළ යුතු බවටත්,

තව ද, 2022 වර්ෂයෙහි පහත උපලේඛන 02 හි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර වාර්ෂික වරිපනම් බද්ද නුවරඑළිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) ක වට්ටමක් ද, එකී උපලේඛන 02 හි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නුවරඑළිය ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එම කාර්තුවට අදාල මුදලින් (5%) වට්ටමක් ද, නුවරඑළිය ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛන 01

අනු. අංකය	*දියුණු ගම් ප්‍රදේශ*	*වරිපනම් ප්‍රතිශතය*
01.	බ්ලැක්පූල් නගරය	15%
02.	නානුඔය නගරය	15%
03.	කඳපොල නගරය	15%
04.	සඳතැන්න නගරය	15%
05.	බුළුඇල නගරය	15%
06.	කටුමාන නගරය	15%
07.	සීතාඑළිය නගරය	15%

උපලේඛන 02

II වැනි තීරුව කාර්තුව	*II වැනි තීරුව ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව 5%ක වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය*
පළමු වැනි කාර්තුව	2022 ජනවාරි මස 01 දින සිට	2022 ජනවාරි මස 31
දෙවන කාර්තුව	2022 අප්‍රේල් මස 01 දින සිට	2022 අප්‍රේල් මස 30
තුන්වන කාර්තුව	2022 ජූලි මස 01 දින සිට	2022 ජූලි මස 31
හතරවන කාර්තුව	2022 ඔක්තෝබර් මස 01 දින සිට	2022 ඔක්තෝබර් මස 30

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

බලපත්‍ර ගාස්තු පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තියෙන් (1) වැනි වගන්තියේ (ආ) ඡේදයෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් 2022 වර්ෂයේ දී කරගෙන යාම සඳහා නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් මත එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම II වැනි තීරයේ නිරූපිත යම් සීමාවන් ඇතුළත වන අවස්ථාවක අනුරූප සටහනේ සඳහන් අනුක්‍රමණය අනුව වූ බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහා සභාවේ දී යෝජනා අංක 05.0.04 යටතේ සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

වෙළෙඳ බලපත්‍ර ගාස්තු නියම කිරීමේ යෝජනාව

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ බලපත්‍ර ලබාගත යුතු යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා නුවරඑළිය ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් සම්බන්ධයෙන්ම, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමග කියවිය යුතු 149 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය හෝ ව්‍යාපාරය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූපී සටහනෙහි නිරූපිත ප්‍රමාණයේ බලපත්‍ර ගාස්තුවක් නියම කර අයකර ගැනීමටත්,

එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත හෝ ව්‍යාපාර අතරින් ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝ සංචාරක මණ්ඩලය මගින් අනුමත කර ඇති හෝ පිළිගෙන ඇති හෝටලයක් හෝ ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක් වන විට එකී හෝටලයෙන් හෝ ආපන ශාලාවෙන් හෝ නවාතැන් පොළෙන් පසුගිය වර්ෂයේ ලත් ලැබීම්වලින් සියයට එකක (1%) මුදල් ගෙවිය යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරුව	*II වැනි තීරුව*		
අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*	
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
1.	ලැඟුම් නිවාස	500 0	750 0	1,000 0
2.	හෝටල්	500 0	750 0	1,000 0
3.	බත් කඩ, ආපන ශාලා සහ තේ හෝ කෝපි කඩ	500 0	750 0	1,000 0
4.	බේකරි	500 0	750 0	1,000 0
5.	කිරි පට්ටි හා කිරි වෙළඳාම	500 0	750 0	1,000 0
6.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
7.	මස් විකිණීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*		
අංකය	*කර්මාන්තයේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය*	*ස්ථානයේ වාර්ෂික වටිනාකම රුපියල්*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
		රු. ශත	*රු. ශත*	*රු. ශත*
8.	අයිස් කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
9.	සිසිල් බීම කර්මාන්ත ශාලා	500 0	750 0	1,000 0
10.	ලොන්ඩරි	500 0	750 0	1,000 0
11.	ගව ගාල්	500 0	750 0	1,000 0
12.	ඝාතක මඩු	500 0	750 0	1,000 0
13.	කොණ්ඩා සැකසීමේ සැළුන් හල් සහ බාබර් සාප්පු	500 0	750 0	1,000 0
14.	අප්‍රසන්න ව්‍යාපාර	500 0	750 0	1,000 0
15.	අන්තරායදායක ව්‍යාපාර	500 0	750 0	1,000 0
16.	අන්තරායදායක සහ අප්‍රසන්න ව්‍යාපාර	500 0	750 0	1,000 0

12 - 66/2

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

කර්මාන්ත බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි උපවගන්තියෙන් පැවරී ඇති (ආ) ඡේදයේ පැවරී ඇති බලතල ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2022 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි උපලේඛනයේ 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව වූ කර්මාන්ත බද්දක් 2022 වර්ෂයේ දී පනවා අය කිරීමට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 05.01.05 අනුව යෝජනා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

කර්මාන්ත වෙළඳ බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත කී පනතේ 152 වැනි වගන්තිය යටතේ ව්‍යාපාර බද්දක් ගෙවීමට යටත් වන යම් ව්‍යාපාරයක් නොවන්නා වූ යම් කර්මාන්තයක් (වෙළඳාම) පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකම පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක, ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක කර්මාන්ත (වෙළඳාම්) බද්දක් 2022 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බව සහ ඒ කර්මාන්ත (වෙළඳාම්) බද්ද ඒ වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

උපලේඛනය

I වැනි තීරය	*II වැනි තීරය*		
කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*රු. 750 ට නොවැඩි*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 දක්වා*	*රු. 1,500ට ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරායදායක/අප්‍රසන්න වෙළෙඳාම			
1. කබොක් ගල්, බොරළු හෝ කළුගල් කැඩීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
2. ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
3. මෝටර් රථ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
4. ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
5. යන්ත්‍රානුසාරයෙන් ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
6. දර ගබඩාවක් හෝ මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
7. සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
8. විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
9. ගිනිකෙළි භාණ්ඩ ගබඩා කිරීම හෝ අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
10. පින්තාරු තීන්ත, වාර්නිෂ්, ඩිස්ටෙම්පර් සායම් වර්ග නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
11. ඇඳුම් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12. සිරප් හෝ පළතුරු බීම නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14. යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය, මාංශ භෝග හෝ වෙනත් ද්‍රව්‍යයක් ඇඹරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. කෘෂි රසායන නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. තේ කුඩු නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. විසිරි පින්තාරු කිරීමේ (ස්ප්‍රේ පේන්ටින්) කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ඉටිපන්දම් නිෂ්පාදනය කිරීමේ හෝ ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. යන්ත්‍ර භාවිතා කරමින් වඩු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20. වී හෝ මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
21. යාන්ත්‍රික නොවන ඉරුම් පට්ටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
22. ඔරලෝසු අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
23. පාවහන් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
24. කිරි ආශ්‍රිත නිෂ්පාදන කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
25. පා පැදි අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
26. මෝටර් බයිසිකල් අලුත්වැඩියා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
27. කඩල, මුරුක්කු නිෂ්පාදනය කර පැකට් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
28. යාන්ත්‍රික නොවන වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
29. බැටරි චාජ් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
30. යාන්ත්‍රික නොවන වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
31. යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකරන කම්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරය	*II වැනි තීරය*		
කර්මාන්තය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*රු. 750 ට නොවැඩි*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 දක්වා*	*රු. 1,500ට ට වැඩි*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
අන්තරායදායක/අප්‍රසන්න වෙළෙඳාම			
32.කරවල, ලුණු මාළු, ජාඩි, ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
33. රස කැවිලි නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
34. පින්තූර රාමු කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
35. පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් ගබඩා කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
36. අයිස් ක්‍රීම් සෑදීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
37. ඇඳුම් මැසීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
38. වළං සෑදීමේ හෝ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
39. වයරින් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
40. වීඩියෝ පටි/තැටි විකිණීම හෝ කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
41. සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
42. හස්ත කර්මාන්ත වැඩපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
43. ඡායා පිටපත් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
44. ආයුර්වේද බෙහෙත් නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
45. හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
46. බුලත් පුවක් හෝ මනිබඩු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
47. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
48. ලොන්ඩරියක් හෝ ඩ්‍රයික්ලීන් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ව්‍යාපාර බද්ද පැනවීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (අ) (1) වැනි වගන්තියේ පළමුවැනි කොටසේ නිරූපිත යම් ව්‍යාපාරයක් 2022 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකු මත එකී ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ආදායම දෙවන කොටසේ පළමුවන තීරයේ නිරූපිත යම් අනුප්‍රමාණය අනුව වූ බද්දක් පනවා අය කිරීමට, සහ

(ආ) (3) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව බද්දට යටත් සෑම තැනැත්තෙකු විසින් ම යටෝක්ත බද්ද 2022 අප්‍රේල් මස 01 වැනි දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි නියම කිරීමට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05.01.06 අනුව යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ව්‍යාපාර බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලය යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන ඉහත කී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීමට යටත්වන අවස්ථාවක ඒ ව්‍යාපාරයෙන් පෙර වර්ෂයේදී ලැබූ ආදායම් පහත උප ලේඛනයේ I වැනි තීරුවේ සඳහන් යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක ඒ උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් ප්‍රමාණයට සමාන මුදලක ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා නියම කර අයකර ගත යුතු බවත් එම ගාස්තු අප්‍රේල් මස 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවී යුතු බවට යෝජනා කරමි.

පළමු කොටස

I වැනි තීරය	*II* වැනි තීරය
බද්ද අදාළ වර්ෂයට පෙර වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	*රු. ශත*
(i) රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
(ii) රු. 6,000 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
(iii) රු. 12,000 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
(iv) රු. 18,750 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
(v) රු. 75,000 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
(vi) රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

දෙවන කොටස

1. යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පවත්වාගෙන යාම
2. දැව ගබඩාවක් පවත්වාගෙන යාම
3. තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
4. නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම
5. ඇඟළුම් කම්හලක් පවත්වාගෙන යාම
6. වාහන සේවා ස්ථානයක් පවත්වාගෙන යාම
7. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
8. එළවළු ගබඩා කිරීමේ හෝ එළවළු තොග විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
9. මස් පිණිස කුකුළන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
10. බිත්තර සඳහා කිකිළියන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
11. බැටළුවන් හෝ ඌරන් හෝ එළුවන් ඇති කරන ස්ථානයක් පවත්වාගෙන යාම
12. කිරි පට්ටියක් හෝ ගව ගාලක් පවත්වාගෙන යාම
13. සත්ව ආහාර නිෂ්පාදනය හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
14. පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යාම
15. නවාතැන් පොළක් පවත්වාගෙන යාම
16. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම
17. විසිතුරු මත්ස්‍යයන් ඇති කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
18. නාට්‍ය සංදර්ශනයක්, ක්‍රීඩා සංදර්ශනයක් හෝ සංගීත සංදර්ශනයක් පැවැත්වීම
19. රූපලාවන්‍ය ආයතනයක් පවත්වාගෙන යාම
20. ශබ්දවාහිනී යන්ත්‍ර කුළියට දීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
21. මල් වෙළෙඳ සැලක් පවත්වාගෙන යාම
22. විසිතුරු පැළ හෝ මල් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
23. කොමිස් ඒජන්සි ස්ථානයක් පවත්වාගෙන යාම
24. වෙන්දේසි කිරීමේ කටයුතු කරන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
25. බ්‍රෝකර් ආයතනයක් පවත්වාගෙන යාම
26. මුදල් ආයෝජන ස්ථානයක් පවත්වාගෙන යාම
27. ලොතරැයි අලෙවි නියෝජිත ස්ථානයක් පවත්වාගෙන යාම
28. අපනයන නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම

29. මෝටර් රථ වාහන වෙළෙඳාම් ආයතනයක් පවත්වාගෙන යාම
30. මැණික් වෙළෙඳ ස්ථානයක් පවත්වාගෙන යාම
31. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
32. රැකියා ඒජන්සි ආයතනයක් පවත්වාගෙන යාම
33. පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
34. උකස් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
35. කොන්ත්‍රාත් කටයුතු සිදුකරන ආයතනයක් පවත්වාගෙන යාම
36. රියදුරු හෝ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
37. භාණ්ඩ හෝ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
38. බැංකු හෝ සේවා සැපයීමේ ආයතනයක් පවත්වාගෙන යාම
39. ඒජන්තවරුන් මාර්ගයෙන් බඩු විකුණන ආයතනයක් පවත්වාගෙන යාම
40. පෞද්ගලික සායන හෝ සාත්තු නිවාසයක් පවත්වාගෙන යාම
41. මත්පැන් අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
42. තොග භාණ්ඩ අලෙවි ස්ථානයක් පවත්වාගෙන යාම
43. සම්ප්‍රේෂණ කුළුණක් පවත්වාගෙන යාම
44. විදුලි උත්පාදනය ස්ථානයක් පවත්වාගෙන යාම
45. සම්බාහන ආයතනයක් පවත්වාගෙන යාම
46. ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
47. විදුලි උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. විදුලි කාර්මික වැඩපොලක් හෝ රූපවාහිනී/ගුවන් විදුලි යන්ත්‍ර නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
49. තේ කුඩු නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
50. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
51. ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
52. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ/ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
53. ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
54. පරණ පුවත්පත් හෝ හිස් බෝතල් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
55. කුෂන් වැඩපොලක් පවත්වාගෙන යාම
56. පරිගණක ආශ්‍රිත මුද්‍රණ කටයුතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම
57. ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
58. දුරකථන පණිවුඩ ලබාදෙන ස්ථානයක් පවත්වාගෙන යාම
59. විදුලි උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
60. ප්ලාස්ටික් භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
61. රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
62. පිඟන් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
63. පොත්, ලිපි ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
64. වාහන අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
65. සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම
66. පළතුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
67. බීජ වර්ග හා පැළ විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
68. ශීත ආහාර හා සිල්ලර බඩු අලෙවි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
69. ඇසුරුම් මාළු විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
70. යකඩ හා වානේ ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
71. නිමි ඇඳුම් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
72. ඉංග්‍රීසි බෙහෙත් අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
73. ලිහිසි තෙල් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
74. සිංහල බෙහෙත් අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
75. සිමෙන්ති ගල් හෝ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම
76. පොහොර හෝ රසායනික පොහොර නිෂ්පාදනය හෝ ගබඩා කර තබා ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ජලය සැපයීමේ ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් හා නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත් යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කර ගැනීමට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහ සභා රැස්වීමේදී යෝජනා අංක 05.01.06 අනුව සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ජලය සැපයීම වෙනුවෙන් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය යටතේ හා 9 (3) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව සහ 126 වැනි වගන්තිය යටතේ සම්පාදනය කරන ලද්දා වූ 1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 (පළාත් පාලන) අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ ප්‍රකාශ කරන ලද්දා වූ සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි 34 වැනි ඛාණ්ඩයේ 40(1) අතුරු ව්‍යවස්ථාව යටතේ නුවරඑළිය ප්‍රාදේශීය සභාව මගින් සපයනු ලබන ජල සේවාවන් සඳහා උපලේඛනය පරිදි ජල ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අයකරවා ගත යුතුයැයි යෝජනා කරමි.

උපලේඛනය

ගෘහස්ථ

මාසික පාරිභෝගික ඒකක	*ඒකකය සඳහා පරිහරණ ගාස්තුව රුපියල්*	*සේවා ගාස්තුව රුපියල්*
00-05	04 0	100 0
06-10	08 0	
11-15	15 0	
16-20	25 0	
21-25	55 0	
26-30	80 0	
31-40	100 0	
41-50	120 0	
51-75	130 0	
75<	150 0	

රාජ්‍ය ආයතන/ව්‍යාපාරික/හෝටල්

මාසික ඒකක ගණන	*ඒකකයක් සඳහා පරිහරණ ගාස්තුව රුපියල්*	*සේවා ගාස්තුව (රාජ්‍ය ආයතන/ව්‍යාපාර) රුපියල්*	*සේවා ගාස්තුව හෝටල් සඳහා රුපියල්*
00-10	25 0	150 0	250 0
11-20	35 0		
21-30	45 0		
31-40	55 0		
41-50	65 0		
51-60	75 0		
61-70	85 0		
71-80	95 0		
81-90	105 0		
91-100	115 0		

පාසල් සඳහා මුල් ඒකක 20 සඳහා හා පූජ්‍ය ස්ථාන සඳහා මුල් ඒකක 25 පසුකිරීමෙන් පසුව පරිහරණය කිරීමේ ගාස්තු අයකරනු ලබේ.

12 - 66/5

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

සේවා සඳහා ගාස්තු අයකිරීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් හා නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කර ගත යුතු යැයි 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති විශේෂ සභා රැස්වීමේ දී යෝජනා අංක 05.01.08 අනුව යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සේවා සඳහා ගාස්තු අය කිරීම - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පැවරී ඇති බලතල ප්‍රකාරව සහ වෙනත් පනත් සහ නීති මගින් පැවරී ඇති බලතල අනුව සහ 1952 වසරේ අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ පැවරී ඇති බලතල අනුව පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකර ගත යුතු යැයි යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	ගාස්තු විස්තරය	මුදල රු. ශත
01	වරිපනම් ලේඛනයේ නම මාරු කිරීමේ අයදුම්පත් ගාස්තුව	115 0
02	පරිසර බලපත්‍ර අයදුම්පත්‍ර ගාස්තු	500 0
03	වීථිරේඛා සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,150 0
04	නොපවරා ගැනීමේ නිකුත් කිරීමේ ගාස්තු	1,150 0
05	හිමිකම් සහතික නිකුත් කිරීමේ ගාස්තු	1,150 0
06	ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු	1,150 0
07	වරිපනම් දේපල නම් සංශෝධනය කිරීමේ ගාස්තු	1,150 0
08	ක්‍රීඩාපිටිය වෙන් කරවා ගැනීම - පාසල් සඳහා	-
09	ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා පිටිය වෙන් කරවා ගැනීම	2,800 0
10	සංගීත සංදර්ශන හා වෙනත් සැණකෙළි සඳහා ක්‍රීඩා පිටිය වෙන් කරවා ගැනීම	1,200 0
11	පා පැදි බලපත්‍ර ගාස්තු	150 0
12	ත්‍රී රෝද රථ ගාස්තු අය කිරීම - ලියාපදිංචිය සඳහා (එක් රථයක් සඳහා)	3,500 0
13	ත්‍රී රෝද රථ නවතා තැබීමේ ගාස්තු අය කිරීම එක් මසකට එක් රථයක් සඳහා	150 0
14	විසන්ධි කරන ලද නව ජල සම්බන්ධතාවයක් නැවත ලබා ගැනීමේ ගාස්තු	1,200 0
15	මස් ප්‍රවාහනය කිරීමේ ගාස්තු (ගව/එළු මස්) එක් දිනක් සඳහා	1,000 0
16	නව විදුලි සම්බන්ධතාවයක් ලබා දීම වෙනුවෙන් නිර්දේශ කිරීමේ ගාස්තු	1,150 0
17	පුස්තකාල සාමාජික ගාස්තු - පාසල් ළමුන් සඳහා	50 0
18	පුස්තකාල සාමාජික ගාස්තු - වැඩිහිටි	100 0
19	පුටු කුළියට ලබා දීම (එක් පුටුවක් සඳහා)	10 0
20	ජල බවුසරය කුළියට දීම	6,000 0
21	ආහාර පිණිස/උත්සව අවස්ථාවක් සඳහා එළුවෙකු	1,000 0

12 - 66/6

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය වෙනුවෙන් අයකිරීමට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 05.01.09 අනුව යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරක දැන්වීම් ස්වභාවය*	*වර්ග අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව රු. ශත*
01	කිසියම් බිත්තියක, බැම්මක පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම	150 0
02	කිසියම් පෞද්ගලික හෝ නිවසක හෝ ගොඩනැගිල්ලක බිත්තියක, වහලයක හෝ තාප්පයක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා සෑම වර්ග අඩියකට ම	100 0
03	ප්‍රචාරක බැනර් සඳහා වර්ග අඩියකට ම	75 0
04	ලී රාමුවකට සවි කරන ලද කණ්ණුවල හෝ ගස් ආදියේ ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා සෑම වර්ග අඩියකටම	75 0

ප්‍රචාරක දැන්වීම්/දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 1988.08.23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්, දෘෂ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නුවරඑළිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට, ගඟකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2022 වර්ෂය වෙනුවෙන් අයකිරීමට යෝජනා කරමි.

උපලේඛනය

අනු. අංකය	*ප්‍රචාරක දැන්වීමේ ස්වභාවය*	*වර්ග අඩියක් සඳහා වාර්ෂික ගාස්තුව රු. ශත*
01	කිසියම් බිත්තියක, බැම්මක පුවරුවක ප්‍රදර්ශනය කරන දැන්වීමක් සඳහා සෑම වර්ග අඩියකට ම	150 0
02	කිසියම් පෞද්ගලික හෝ නිවසක හෝ ගොඩනැගිල්ලක බිත්තියක, වහලයක හෝ තාප්පයක දැන්වීම් ප්‍රදර්ශනය සඳහා සෑම වර්ග අඩියකට ම	100 0
03	ප්‍රචාරක බැනර් සඳහා වර්ග අඩියකට	75 0
04	ලී රාමුවකට සවි කරන ලද කණ්ණුවල හෝ ගස් ආදියේ ප්‍රදර්ශනය කරන දැන්වීම් සඳහා සෑම වර්ග අඩියකටම	75 0

12 - 66/7

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

ඉඩම් විකිණීම මත බදු අයකිරීම - 2022 වර්ෂය

නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිත විසින් හෝ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව ගෙවිය යුතු බවට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහා රැස්වීමේදී යෝජනා අංක 05.01.10 අනුව යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ඉඩම් විකිණීම මත බදු අය කිරීම - 2022

නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යම් ඉඩමක් වෙන්දේසිකරුවකු හෝ තැරැව්කරුවකු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුනියෝජිතයා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයෙන් විකුණනු ලබන ඔහුගේ සේවකයා හෝ අනු නියෝජිත විසින් හෝ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව ගෙවිය යුතු බවට යෝජනා කරමි.

12 - 66/8

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු - 2022 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍යවන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළ හැකි වැනි අවස්ථාවක, සහ

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, හෝ

(ආ) සැබැවින්ම ගොඩනැගිලිවලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ, හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ,

අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඒ ඉඩමේ අයිතිකරුගෙන් අයකර ගත යුතු බවට, 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති විශේෂ සභා රැසවීමේ දී යෝජනා අංක 05.01.11 අනුව යෝජනා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

සංවර්ධනය නොකළ ඉඩම් සඳහා බදු - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153(1) වගන්තිය අනුව ප්‍රාදේශීය සභා ප්‍රදේශයක සීමාවන් ඇතුළත වූ යම් ඉඩමක් ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය සඳහා හෝ නිත්‍ය හෝ විධිමත් ලෙස වගා කිරීමේ කාර්ය සඳහා යෝග්‍ය වන හෝ ප්‍රාදේශීය සභාවේ මතය අනුව සාධාරණ යැයි සැලකෙන වියදමකින් එවැනි යම් කාර්යයක් සඳහා ඒ ඉඩම සංවර්ධනය කළ හැකි වැනි අවස්ථාවක, සහ

(අ) ඒ ඉඩමෙහි කිසිම ගොඩනැගිල්ලක් ඉදිකර නොමැති වූ, හෝ

(ආ) සැබැවින්ම ගොඩනැගිලි වලින් ආවරණය වූ ඒ ඉඩමේ බිම් ප්‍රමාණය ඒ ඉඩමේ මුළු බිම් ප්‍රමාණයට නියමිත සමානුපාතයට වඩා අඩු සමානුපාතයක් ප්‍රාදේශීය සභා යෝජනා සම්මතයක් මගින් දරන්නා වූ, හෝ

(ඇ) ඒ ඉඩම විධිමත් හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැත්තා වූ,

අවස්ථාවක ප්‍රාදේශීය සභාව විසින් ඒ ඉඩමේ ප්‍රාග්ධන බිම් අගයෙන් සියයට දෙකක් නොඉක්මවන බද්දක් වාර්ෂිකව ඒ ඉඩමේ අයිතිකරුගෙන් අයකර ගත යුතු බවට යෝජනා කරමි.

12 - 66/9

නුවරඑළිය ප්‍රාදේශීය සභාව

අක්කර බදු පැනවීම - 2022 වර්ෂය

1987 අංක දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාව විසින්, යම් ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද, එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් අය කළ යුතු බවට 2021 සැප්තැම්බර් මස 11 වැනි දින පැවති මහා සභා රැස්වීමේ දී යෝජනා අංක 05.01.12 අනුව සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

වේළු යෝගරාජ්,
සභාපති,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව.

2021 සැප්තැම්බර් මස 11 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

අනු. අංකය	*ඉඩම් ප්‍රමාණය*	*බදු අනුප්‍රමාණය වර්ෂයකට*
01	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	රු. 50 0
02	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන අවස්ථාවක	රු. 10 0

අක්කර බදු පැනවීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය අනුව ප්‍රාදේශීය සභාව විසින්, යම් ප්‍රාදේශීය සභාවක සීමා ඇතුළත පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූ ද, එක් එක් ඉඩම් හෙක්ටයාරයක් මත ම පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් අය කළ යුතු බවට යෝජනා කරමි.

අනු. අංකය	*ඉඩම් ප්‍රමාණය*	*බදු අනුප්‍රමාණය වර්ෂයකට*
01	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහකට අඩු නමුත් හෙක්ටයාර් එකකට නොඅඩු වන අවස්ථාවක	රු. 50 0
02	ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් පහක් හෝ ඊට වැඩිවන අවස්ථාවක	රු. 10 0

12 - 66/10

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදාළ අතුරු ව්‍යවස්ථා යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 386 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්තිය යටතේ ප්‍රදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ එකී පනත යටතේ නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2010.10.15 වැනි දින අංක 1676 දරන ගැසට් පත්‍රයෙන් හා 2011.12.09 වැනි දින අංක 1736 දරන ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ එම උපලේඛනයේ II වැනි තීරුවේ නිරූපිත යම් කාර්යයක් සඳහා නවගත්තේගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත යම් ස්ථානයක් හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2022 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් එම උපලේඛනයේ III වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්,

තව ද, එකී උපලේඛනයේ සඳහන් කර්මාන්ත 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝ ලියාපදිංචි කර ඇති හෝටලයක්, ආපන ශාලාවක්, නවාතැන් පළක් වැනි විට දී, ඊට අදාළ බලපත්‍ර ලබාදීමේ දී එකී හෝටලයෙන්, ආපන ශාලාවෙන්, නවාතැන් පොළෙන්, 2021 වර්ෂයේ ලැබීම්වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් ලෙස 2022 වර්ෂය සඳහා අය කිරීමටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

තව ද ඉහත කී උපලේඛනයේ II තීරුවේ නිරූපිත යම් කාර්යයක් සිදු කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුම 2022 වර්ෂය සඳහා වූ වෙළෙඳ බලපත්‍රය 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ලබාගත යුතු බවට ද නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
සම්මත අතුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
හෝටල්	01	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
බත්කඩ, ආපන ශාලා	02	බත් කඩයක්	500 0	750 0	1,000 0
තේ හෝ කෝපි කඩ	03	තේ කඩයක්	300 0	750 0	1,000 0
	04	ආපන ශාලාවක්	500 0	750 0	1,000 0
	05	කෝපි කඩයක් පවත්වාගෙන යාම	300 0	500 0	1,000 0
බේකරි	06	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
සම්මත අතුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
කිරි පට්ටි හා කිරි වෙළෙඳාම	07	කිරි ආශ්‍රිත නිෂ්පාදන ආයතනයක්	500 0	750 0	1,000 0
මාළු විකිණීම	08	මාළු වෙළඳාම් කිරීම්	500 0	750 0	1,000 0
මස් විකිණීම	09	මස් අලෙවි කිරීමේ ස්ථානයක්	500 0	750 0	1,000 0
අයිස් කර්මාන්තශාලා	10	අයිස් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
සිසිල් බීම කර්මාන්තශාලා	11	සිසිල් බීම නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
ලොන්ඩරි	12	ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
කොණ්ඩා සැකසීම හා බාබර් සාප්පු	13	සැලුන් එකක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
		අප්‍රසන්න ව්‍යාපාර			
	14	මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	15	පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
	16	සම් පදම් කිරීම	500 0	750 0	1,000 0
	17	සම් විකිණීමට තබා ගැනීම	500 0	750 0	1,000 0
	18	සත්ත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)	500 0	750 0	1,000 0
අප්‍රසන්න, අන්තරාදායක	19	උම්බලකඩ නිෂ්පාදනය	500 0	750 0	1,000 0
අප්‍රසන්න හා අන්තරාදායක	20	පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
ව්‍යාපාර	21	තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම	500 0	750 0	1,000 0
	22	කරවල, ලුණු මාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම	500 0	750 0	1,000 0
	23	මාළු හෝ ජාඩි දූමීම හෝ වේලීම හෝ අයිස් දැමීම	500 0	750 0	1,000 0
	24	පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම	500 0	750 0	1,000 0
	25	දුම්කොළ වියළීම	500 0	750 0	1,000 0
	26	සත්ත්ව ආහාර නිපදවීම	500 0	750 0	1,000 0
	27	පුන්නක්කු නිපදවීම	500 0	750 0	1,000 0
	28	සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම	500 0	750 0	1,000 0
	29	සබන් නිෂ්පාදනය කිරීම	500 0	750 0	1,000 0
	30	සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම	500 0	750 0	1,000 0
	31	ට්‍රන්ක් පෙට්ටි සෑදීම	500 0	750 0	1,000 0
	32	අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම	500 0	750 0	1,000 0
	33	ලෝහ සුන්බුන් තබා ගැනීම	500 0	750 0	1,000 0
	34	ගෘහ භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	35	වේවැල් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	36	වඩු කර්මාන්තශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
සම්මත අතුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
	37	සිරප් හෝ පළතුරු බීම නිපදවීම	500 0	750 0	1,000 0
	38	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
	39	පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම)	500 0	750 0	1,000 0
	40	බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර)	500 0	750 0	1,000 0
	41	දත් බුරුසු නිපදවීම	500 0	750 0	1,000 0
	42	රා එකතු කිරීම	500 0	750 0	1,000 0
	43	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
	44	දුව ඉරීම	500 0	750 0	1,000 0
	45	පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම	500 0	750 0	1,000 0
	46	සෝඩා නිපදවීම	500 0	750 0	1,000 0
	47	කෙඳි සායම් කිරීම	500 0	750 0	1,000 0
	48	සම් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	49	පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම	500 0	750 0	1,000 0
	50	කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම	500 0	750 0	1,000 0
	51	බේකින් පවුඩර් නිපදවීම	500 0	750 0	1,000 0
	52	ගෑස් මැන්ටල් නිපදවීම	500 0	750 0	1,000 0
	53	පොටි නිපදවීම	500 0	750 0	1,000 0
	54	ඉටි පන්දම් නිපදවීම	500 0	750 0	1,000 0
	55	කපුරු නිපදවීම	500 0	750 0	1,000 0
	56	ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම	500 0	750 0	1,000 0
	57	රෙදි සෝදන නිල් නිපදවීම	500 0	750 0	1,000 0
	58	ලාකඩ නිපදවීම	500 0	750 0	1,000 0
	59	සුවඳ විලවුන් නිපදවීම	500 0	750 0	1,000 0
	60	පාසල් රටහුණු නිපදවීම	500 0	750 0	1,000 0
	61	ටයර් හෝ ටියුබ් නිපදවීම	500 0	750 0	1,000 0
	62	ටයර් නැවත පිරවීම	500 0	750 0	1,000 0
	63	ටයර්, ටියුබ් වෝල්කනයිසින් කිරීම	500 0	750 0	1,000 0
	64	සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	65	වැලි කඩදාසි නිපදවීම	500 0	750 0	1,000 0
	66	ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	67	ගඩොල් නිපදවීම	500 0	750 0	1,000 0
	68	යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම	500 0	750 0	1,000 0
	69	අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම	500 0	750 0	1,000 0
	70	උළු නිපදවීම	500 0	750 0	1,000 0
	71	පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම	500 0	750 0	1,000 0
	72	යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
සම්මත අනුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
		අන්තරාදායක ව්‍යාපාර :			
	73	කළු ගල් කැඩීම හෝ කැණීම	500 0	750 0	1,000 0
	74	එළවළු තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
	75	පොල්තෙල් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
	76	ගිනි පෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	77	මෙතිලේටඩ් ස්පීතු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
	78	තේ පෙට්ටි නිපදවීම	500 0	750 0	1,000 0
	79	කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම	500 0	750 0	1,000 0
	80	කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිපදවීම	500 0	750 0	1,000 0
	81	පිදුරු තබා ගැනීම	500 0	750 0	1,000 0
	82	පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	83	ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	84	යන්ත්‍රනුසාරයෙන් ලී ඉරීම	500 0	750 0	1,000 0
	85	හිරිගල් හෝ හුණුගල් කැණීම	500 0	750 0	1,000 0
	86	යන්ත්‍රානුසාරයෙන් පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම	500 0	750 0	1,000 0
	87	හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම	500 0	750 0	1,000 0
	88	පාපැදි හෝ යතුරු පැදි අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	89	පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම	500 0	750 0	1,000 0
	90	විසිරි පින්තාරු කිරීම	500 0	750 0	1,000 0
	91	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම	500 0	750 0	1,000 0
	92	ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)	500 0	750 0	1,000 0
		අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර :			
	93	තලාතු මිනිරන් සුද්ද කිරීම	500 0	750 0	1,000 0
	94	රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම	500 0	750 0	1,000 0
	95	ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම	500 0	750 0	1,000 0
	96	රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම	500 0	750 0	1,000 0
	97	විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම	500 0	750 0	1,000 0

I වැනි තීරුව		*II වැනි තීරුව*	*III වැනි තීරුව ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
සම්මත අතුරු ව්‍යවස්ථාව	*අනු. අංකය*	*බලය දෙනු ලබන කාර්යය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක*	*රු. 750ට වැඩි එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
			රු. ශත	*රු. ශත*	*රු. ශත*
	98	තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම	500 0	750 0	1,000 0
	99	හුණු ගල් හෝ හිරිගල් පිළිස්සීම	500 0	750 0	1,000 0
	100	ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම	500 0	750 0	1,000 0
	101	මෝර තෙල් සකස් කිරීම	500 0	750 0	1,000 0
	102	බෝට්ටු තැනීම	500 0	750 0	1,000 0
	103	බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	104	ලෝහ වර්ග පෑස්සවීම	500 0	500 0	1,000 0
	105	මෝටර් වාහන අළුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
	106	මෝටර් වාහන සේවා කිරීම	500 0	750 0	1,000 0
	107	යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම	500 0	750 0	1,000 0
	108	වාත්තු මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	109	බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
	110	මෝටර් වාහන බොඩි තැබීම	500 0	750 0	1,000 0
	111	කෘමි නාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම හෝ නැවත පිරවීම	500 0	750 0	1,000 0
	112	විෂබීජ නාශක නිපදවීම	500 0	750 0	1,000 0
	113	මදුරු දඟර නිපදවීම	500 0	750 0	1,000 0

12 - 57/1

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 387 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 10 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාරව, නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු එම බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නවගත්තේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

I වැනි තීරුව		*II වැනි තීරුව* *ස්ථානයේ වාර්ෂික වටිනාකම*		
අනු. අංකය	*කර්මාන්තයේ ස්වභාවය*	*රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1.500 නොඉක්මවන අවස්ථාවක රු.ශත*	*රු, 1.500 ඉක්මවන අවස්ථාවක රු.ශත*
01.	ඇඳුම් මැසීමේ මධ්‍යස්ථානයක්	300 0	500 0	1000 0
02.	පින්තූර රාමු කරන ස්ථානයක්	300 0	500 0	1000 0
03.	දැන්වීම් පුවරු බැනර්, කටවුට්, පෝස්ටර් ඇඳීම	300 0	500 0	1000 0
04.	මුද්‍රණාලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1000 0
05.	විදුලි භාණ්ඩ අලුත්වැඩියා කිරීමේ ස්ථානයක්	300 0	500 0	1000 0
06.	හඳුන්කුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක්	300 0	500 0	1000 0

12 - 57/2

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බද්ද පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 388 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන් ම එකී ව්‍යාපාරයේ 2021 වර්ෂයේ ලැබීම්, මෙහි පහත උපලේඛනයෙහි 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංක සීමාවන් ඇතුළත පවතින අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් යම් තැනැත්තෙකු එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නවගත්තේගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය."

උපලේඛන

අනු. අංකය	*I වැනි තීරුව* *2021 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම*	*II වැනි තීරුව* *රු.ශත*
01.	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නොමැත
02.	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03.	රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04.	රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05.	රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06.	රු. 1,50,000 ඉක්මවන විට	3,000 0

12 - 57/3

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 389 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1988 අගෝස්තු මස 23 වැනි දින අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත්කරන ලද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 වැනි වගන්තිය ප්‍රකාර, බලය ලැබී ඇති පරිදි නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් වැළඳගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථා මාලාවේ 39 වැනි කොටසේ දෘෂ්‍ය පරිසරය/ ප්‍රචාරක දැන්වීම් අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ප්‍රචාරක දැන්වීම් ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ද, නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

		රු. ශත
01.	බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට (වර්ෂයකට)	60 0
02.	බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01 කට අඩු කාලයක් ප්‍රදර්ශනය කිරීම සඳහා වර්ග අඩියකට	20 0
03.	බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 01 කට නොඅඩු සහ මාස 03 කට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට	30 0
04.	බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 03 කට නොඅඩු සහ මාස 06 කට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට	40 0
05.	බැනරයක් මඟින් ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මාස 06 කට නොඅඩු සහ වර්ෂයකට නොවැඩි කාලයක් සඳහා වර්ග අඩියකට	50 0

12 - 57/4

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ 2022 වර්ෂය සඳහා ගාස්තු පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 390 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමඟ කියවිය යුතු 261 වැනි අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2010.07.16 වැනි දින අංක 1663 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූ වයඹ පළාතේ පළාත් සභාව විසින් ස්ථිර කරන ලද, 2011.04.28 වැනි දින අංක 1703/18 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූ ද නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන 2011.12.09 වැනි දින අංක 1736 දරන *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශයට පත්කර ඇති " ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම" පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථාවේ (4) (5) වගන්ති මගින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් වාහන නවතා තැබීමේ සුදුසු ස්ථාන වශයෙන් යෝජනා සම්මත කර ප්‍රකාශයට පත්කර ඇති පහත උපලේඛනයේ සඳහන් ස්ථානයන් හි (නවගත්තේගම පොදු බස් නැවතුම්පොළෙහි හැර) නවතා තබන වාහන සඳහා රු.600 ක වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ද, නවගත්තේගම පොදු බස් නැවතුම්පොළෙහි නවතා තබන බස් රථයක් සම්බන්ධයෙන් එක් දිනක් සඳහා රු. 100 0 ක ගාස්තුවක් ද, එම අතුරු ව්‍යවස්ථාවේ (15) වැනි වගන්තිය මගින් ලැබී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභා සීමාව තුළ ඇති යම් මාවතක හෝ වීදියක හෝ ආදායමක් උපයා ගැනීමේ අරමුණක් ඇතිව නවතා ඇති යම් වාහනයකින් දිනකට රු. 100 0ක ගාස්තුවක් ද, 2022 වර්ෂය වෙනුවෙන් පනවා අය කිරීමටත් (5) වැනි වගන්තිය යටතේ වන ගාස්තු 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ද, නවගත්තේගම පොදු බස් නැවතුම්පොළෙහි නවතා තබන වාහනයක් සම්බන්ධයෙන් වන විට වාහනය නවතා තබන මොහොතේ දී ද ගෙවිය යුතු බවටත්, (15) වැනි වගන්තිය යටතේ වන ගාස්තු වාහන නවතා තබන මොහොතේදී ද ගෙවිය යුතු බවටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.".

උපලේඛනය

01. නවගත්තේගම ඔරලෝසු කණුව අසල කුළී වාහන නැවතුම්පොළ
02. නවගත්තේගම බස් නැවතුම්පොළ ඉදිරිපිට කුළී වාහන නැවතුම්පොළ

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වෙනත් ගාස්තු පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 391 යටතේ පහත යෝජනාව සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් පහත උපලේඛනයේ දැක්වෙන ද්‍රව්‍ය හා සේවාවන් සැපයීමට අදාළව ඒ එක් එක් කාර්යය ඉදිරියෙන් දක්වා ඇති ගාස්තු 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

		රු. ශත
01.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ ඉල්ලුම් පත්‍ර ගාස්තුව	250 0
02.	පරිසර බලපත්‍ර ඉල්ලුම් පත්‍ර ගාස්තුව	100 0
03.	පරිසර බලපත්‍ර ප්‍රශ්නාවලිය	100 0
04.	පරිසර බලපත්‍ර අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍ර ගාස්තුව	50 0
05.	පරිසර බලපත්‍ර ගාස්තුව	1,250 0

වර්ෂයක් හෝ ඊට අඩු කාලයක් සඳහා ප්‍රමාද ගාස්තුව බලපත්‍ර ගාස්තුවෙන් 10%කි.
වර්ෂයකට වැඩි කාලයක් සඳහා ප්‍රමාද ගාස්තුව බලපත්‍ර ගාස්තුවෙන් 20%කි.

පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු

මූලික ආයෝජනය	පරීක්ෂණ ගාස්තුව (රු.)
100,000 දක්වා	250 09
100,001 - 200,000	500 0
200,001 - 500,000	1,250 0
500,001 - 1,000,000	2,500 0
1,000,000 ඉහලට	5,000 0

06.	වීථි රේඛා සහතික ගාස්තුව	700 0	
07.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම	750 0	
08.	ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීමේ පෙරසැරි ගාස්තු :		
	(අ) නිවාස සැලසුමක් වන විට :		
	වර්ග අඩි 500ටඅඩු හෝ වර්ග අඩි 500	400 0	
	වර්ග අඩි 501 ත් 1000 ත් අතර	1,000 0	
	වර්ග අඩි 1000ට වැඩි වන විට වැඩිවන සෑම වර්ග අඩියකටම	2 0	බැගින්
	(ආ) ව්‍යාපාරික ස්ථානයක් වන විට :		
	වර්ග අඩි 500 ට අඩු හෝ වර්ග අඩි 500	500 0	
	වර්ග අඩි 501 ත් 1000 ත් අතර	2,000 0	
	වර්ග අඩි 1000 ට වැඩිවන විට වැඩිවන සෑම වර්ග අඩියකටම	5 0	බැගින්

(ඇ) පූර්ව අනුමැතිය ලබාගෙන නොමැති එහෙත් නීත්‍යානුකූලව අනුමැතිය ලබා දිය හැකි ඉදිකිරීමකට අනුමැතිය ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ විට පනවනු ලබන අධි ගාස්තුව.

අත්තිවාරම දැමීමෙන් පසු ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා ඉල්ලුම් කිරීමක් වන විට මුළු පෙරසැරි ගාස්තුවෙන් 10% ,

අත්තිවාරම සහ බිත්ති බැඳීමෙන් පසු ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා ඉල්ලුම් කිරීමක් වන විට මුළු පෙරසැරි ගාස්තුවෙන් 20%

අත්තිවාරම සහ බිත්ති සහ වහලය නිම කිරීමෙන් පසු ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා ඉල්ලුම් කිරීමක් වන විට මුළු පෙරසැරි ගාස්තුවෙන් 30%

ගොඩනැගිල්ලේ සියලු වැඩ අවසන් කර ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම සඳහා ඉල්ලුම් කිරීමක් වන විට මුළු පෙරසැරි ගාස්තුවෙන් 50% .

		රු. ශ.	
09.	මිනින්දෝරු සැලසුම් අනුමත කිරීමේ ගාස්තු	600 0	
10.	ජල බවුසරය එකක් සඳහා සැපයීම		
	පළමු කිලෝමීටරය ඇතුලත	800 0	
	වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා	50 0	
11.	ට්‍රැක්ටරය ජල බවුසරය, එක් දිනක කාර්යයක් සඳහා	6,000 0	
	අංක 10 සහ 11 සඳහා ජල මෝටරයට අවශ්‍ය ඉන්ධන සේවය ඉල්ලා සිටින අය විසින් දැරිය යුතුය.		
12.	ට්‍රැක්ටරය කුළියට දීම - එක් දිනක් සඳහා	6,000 0	
13.	ට්‍රැක්ටරය කුළියට දීම - දින 1/2 ක් (වරුවක්) සඳහා	3,500 0	
14.	බැකෝ යන්ත්‍රය කුළියට දීම මීටර් පැය එකක් සඳහා	3,200 0	
15.	මෝටර් ග්‍රේඩරය කුළියට දීම මීටර් පැය එකක් සඳහා	4,500 0	
16.	ඩම්ප් ට්‍රක් රථය (කියුබ් 2.65) කුළියට ලබා දීම :		
	i. එක් දිනක් සඳහා (දිනකට කිලෝ මීටර් 100ක් දක්වා)	10,000 0	
	ii. දින 1/2 (වරුවක් සඳහා කිලෝමීටර් 50 දක්වා)	5,000 0	
	ඉහත 151 සහ ii සඳහා වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා	70 0	බැගින්
17.	කොඩි කණු එකක් සඳහා දිනක කුළිය	20 0	
18.	අවු වැසි ආවරණ කුටි එකක් සඳහා දිනක කුළිය	500 0	
19.	ට්‍රැක්ටරය දුර ප්‍රමාණය අනුව කුළියට දීම :		
	පළමු කිලෝමීටරය ඇතුළත	800 0	
	වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහාම	50 0	බැගින්
20.	පුස්තකාල සාමාජික ගාස්තු :		
	අවුරුදු 12ට වැඩි ඉල්ලුම්කරුවන් සඳහා	50 0	
	අවුරුදු 12ට අඩු ඉල්ලුම්කරුවන් සඳහා	30 0	
21.	පුස්තකාල සාමාජිකත්වය අලුත් කිරීම සඳහා ගාස්තු :		
	අවුරුදු 12ට වැඩි ඉල්ලුම්කරුවන් සඳහා	25 0	
	අවුරුදු 12ට අඩු ඉල්ලුම්කරුවන් සඳහා	15 0	
22.	පුස්තකාල සාමාජික අයදුම් පත්‍ර ගාස්තුව	10 0	
23.	අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් එකක් (ප්‍රවාහනය සහ පැටවීම රහිතව)	36 0	
24.	බහුකාර්ය ගොඩනැගිල්ල කුළියට ලබා දීම :		
	දැනුවත් කිරීමේ වැඩ මුළු (රැස්වීම්) සඳහා පැය 4ක් හෝ		
	ඊට අඩු කාලයක් සඳහා	2,000 0	

		රු.ශ.
	දැනුවත් කිරීමේ වැඩ මුළු (රැස්වීම්) සඳහා පැය 4 කට වැඩි පැය 8 අඩු කාලයක් සඳහා	3,500 0
	දැනුවත් කිරීමේ වැඩ මුළු (රැස්වීම්) සඳහා පැය 8 කට වැඩි පැය 24 අඩු කාලයක් සඳහා	6 00 0
	උත්සව අවස්ථා සඳහා (මංගල, ප්‍රිය සම්භාෂණ ආදිය) පැය 24 ක කාලයකට ගාස්තුව	15,000 0
25.	අලෙවි ප්‍රවර්ධන වැඩසටහනක් සඳහා දිනකට ගාස්තුව	1,000 0

12 - 57/6

නවගත්තේගම ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා වරිපනම් ගාස්තු පැනවීම

නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 14 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 392 යටතේ පහත උපලේඛනයේ දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී සභා සම්මතය සඳහා 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂංගික) විධිවිධාන පනතේ 2 වැනි වගන්තියේ (1) උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) උවගන්තිය ප්‍රකාරව වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත් 2022 වර්ෂය සඳහා පනවන ලද ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් මස 30 සහ දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන්වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා වන සම්පූර්ණ වරිපනම් බද්ද 2022 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක්ද එක් එක් කාර්තුවට අදළ වරිපනම් බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක්ද ගෙවනු ලැබේ.

එස්. එම්. අයි. එස්. සේනාධිපති,
සභාපති,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 01 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට නවගත්තේගම ප්‍රාදේශීය සභාව විසින් ගන්නා ලද සභා සම්මුතියට පුත්තලම දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකී පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019.04.26 දිනැති අංක 2121 දරන *ගැසට්* පත්‍රයෙන් නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ලෙස ප්‍රකාශයට පත් කළ ප්‍රදේශය ඇතුළත පිහිටි සියලුම නිවාස, ගොඩනැගිලි, ඉඩම් හා ගෙවත්වල 2020 වර්ෂයේදී පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ බලතල ක්‍රියාත්මක කරනු ලබන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය මත තක්සේරු කරන වාර්ෂික වටිනාකම් පිළිගැනීමටත්, එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) උපගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත නවගත්තේගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටි සෑම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමෙන් 6%ක වරිපනම් බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් සහ

ඒ වරිපනම් බද්ද එකී ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (6) වැනි වගන්තියේ විධිවිධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දින වලින් අවසන්වන කාර්තු 4 තුළදී සමාන වාරික 4කින් ගෙවීමට විධාන කිරීමටත් නවගත්තේගම ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

12 - 57/7

තලාව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට වරිපනම් බදු පැනවීම

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 26 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ තලාව ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දියුණු කළ ප්‍රදේශය යැයි ප්‍රකාශයට පත්කර ඇත්තා වූ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල, වාර්ෂික වටිනාකම 2009 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව පදනම් කර ගෙන 2021 වර්ෂයට පිළිගෙන ක්‍රියාත්මක කරනු ලැබූ තක්සේරුව 2022 වර්ෂයට පිළිගැනීමටත් එකී තක්සේරුව මත 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර එකී දේපළ වාර්ෂික වටිනාකමින් සියයට දහයක (10%) වාර්ෂික වරිපනම් බද්දක් නියම විය යුතු බවටත්, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 161(අ) (I), (II), (III) වගන්ති ප්‍රකාරව කටයුතු කිරීමටත්,

තව ද, 2022 වර්ෂයෙහි පහත උපලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද තලාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස වාර්ෂික වරිපනම් බද්ද එම වර්ෂයෙහි ජනවාරි මස 31 වැනි දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ III වැනි තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල තලාව ප්‍රාදේශීය සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවට අදාළ මුදලින් 5% ක වට්ටමක් ද තලාව ප්‍රාදේශීය සභාව ලබා දිය යුතු බවටත් තලාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

උපලේඛනය

I වැනි තීරුව *කාර්තුව*	*II වැනි තීරුව* *ගෙවිය යුතු දිනය*	*III වැනි තීරුව* *5% වට්ටම සඳහා හිමිකම්* *ලබන අවසාන දිනය*
පළමුවන කාර්තුව	2022.03.31	2022.01.31
දෙවන කාර්තුව	2022.06.30	2022.04.30
තුන්වන කාර්තුව	2022.09.30	2022.07.31
හතරවන කාර්තුව	2022.12.31	2022.10.31

12-59/1

තලාව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු අයකිරීම

කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාමට අදහස්ව අතුරු ව්‍යවස්ථාව යටතේ 2022 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන බලපත්‍ර මත ගාස්තු පැනවීම තලාව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක 08(1) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒ අනුව කිසියම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් කර්මාන්තයක් පවත්වාගෙන යාම සඳහා 2022 වර්ෂයේ දී තලාව ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මත ගාස්තුවක් අයකරනු ලබන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 26 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

තලාව ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ තලාව ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ 2022 වර්ෂය තුළ දී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 149 වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමට තලාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව		*II වැනි තීරුව*		
බලපත්‍රයේ බලය දෙනු ලබන කාර්යය		*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත*
01.	ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02.	හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03.	බත් කඩයක් පැවැත්වීම	500 0	750 0	1,000 0
04.	ආපනශාලාවක් පැවැත්වීම	500 0	750 0	1,000 0
05.	තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06.	කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07.	බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08.	කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09.	කිරි විකිණීම	500 0	750 0	1,000 0
10.	මාළු විකිණීම	500 0	750 0	1,000 0
11.	මස් විකිණීම	500 0	750 0	1,000 0
12.	අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	සිසිල්බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
14.	ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15.	ගව ගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16.	පෞද්ගලික වෙළෙඳපොළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17.	කොණ්ඩා සැකසීමේ සැලුන් හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18.	බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19.	ගෝ ඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

තලාව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2021 ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08(2) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද එම කර්මාන්ත බද්ද එම වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 26 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එම උපලේඛනයෙහි II වැනි තීරුවේ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට සරිලන අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයට කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු බවටත්, එම කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු විසින් 2022 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර තලාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත්, තලාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

I වැනි තීරුව *කර්මාන්තය*		*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත*
01.	පැණි නිපදවීම	500 0	750 0	1,000 0
02.	කෘත්‍රිම පොහොර හෝ කෘත්‍රිම පොහොර සෑදීම සඳහා ගනු ලබන ද්‍රව්‍ය ගෝනි විකිණීම	500 0	750 0	1,000 0
03.	සුරුට්ටු නිපදවීම	500 0	750 0	1,000 0
04.	කොප්පරා නිපදවීම සහ සකස් කිරීම	500 0	750 0	1,000 0
05.	කබොක් කළුගල් කැඩීම	500 0	750 0	1,000 0
06.	මිනිරන් වේලීම	500 0	750 0	1,000 0
07.	කොහු නිපදවීම හා ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0
08.	බැටරි චාජ් කිරීම	500 0	750 0	1,000 0
09.	ටයර් ටියුබ් වොල්කනයිස් කිරීම	500 0	750 0	1,000 0
10.	බයිසිකල් අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
11.	බෙලෙක් වැඩපළක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
12.	දර මඩුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
13.	විදුලි හෝ රේඩියෝ අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
14.	රසකැවිලි නිපදවීම	500 0	750 0	1,000 0
15.	විදුලි උපකරණ හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම	500 0	750 0	1,000 0
16.	විනාකිරි නිපදවීම	500 0	750 0	1,000 0
17.	පින්තූර රාමු කිරීම	500 0	750 0	1,000 0

	I වැනි තීරුව *කර්මාන්තය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
		රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශත	*රු. 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශත*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශත*
18.	වෙළෙඳාම සඳහා සෙල්ලම් බඩු නිපදවීම	500 0	750 0	1,000 0
19.	කඩල/වඩේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
20.	බීඩි නිපදවීම	500 0	750 0	1,000 0
21.	බිම්මල් වගා කිරීම හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
22.	පොරි නිෂ්පාදනය හා අලෙවි කිරීම	500 0	750 0	1,000 0
23.	හඳුන්කුරු නිෂ්පාදනය හා අලෙවිය	500 0	750 0	1,000 0
24.	සබන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0
25.	යකඩ කම්හලක්	500 0	750 0	1,000 0
26.	කළුගල් පිපිරවීම හෝ කළුගල් වැඩපලක්	500 0	750 0	1,000 0
27.	යන්ත්‍රානුසාරයෙන් හෝ යන්ත්‍ර නොමැතිව ගඩොල්, උළු පිළිස්සීම	500 0	750 0	1,000 0
28.	සපත්තු පාවහන් නිෂ්පාදනය	500 0	750 0	1,000 0

12-59/3

තලාව ප්‍රාදේශීය සභාව

2022 වර්ෂයට ව්‍යාපාර බදු

තලාව ප්‍රාදේශීය සභාව විසින් 2021 වර්ෂයේ ඔක්තෝබර් මස 26 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 08(3) යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2022 වර්ෂය සඳහා පනවන ලද ඒ ව්‍යාපාර බද්ද එම වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත්, වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

ටී. එම්. ඉන්දික උදය කුමාර තෙන්නකෝන්,
සභාපති,
තලාව ප්‍රාදේශීය සභාව.

2021 ඔක්තෝබර් මස 26 වැනි දින,
තලාව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී පනතේ 150 වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් තලාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනු ප්‍රමාණය අනුව ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ අප්‍රේල් 30 වැනි දිනට පෙර තලාව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් තලාව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නී ය.

උපලේඛනය

	I වැනි තීරුව 2021 වර්ෂයේ දී ව්‍යාපාරයේ ආදායම	*II* වැනි තීරුව රු. ශත
01	රු. 6,000 නොඉක්මවන අවස්ථාවක	නැත
02	රු. 6,000 ඉක්මවන එහෙත් රු. 12,000 නොඉක්මවන අවස්ථාවක	90 0
03	රු. 12,000 ඉක්මවන එහෙත් රු. 18,750 නොඉක්මවන අවස්ථාවක	180 0
04	රු. 18,750 ඉක්මවන එහෙත් රු. 75,000 නොඉක්මවන අවස්ථාවක	360 0
05	රු. 75,000 ඉක්මවන එහෙත් රු. 1,50,000 නොඉක්මවන අවස්ථාවක	1,200 0
06	රු. 1,50,000 ඉක්මවන අවස්ථාවක	3,000 0

1. ඇඟලුම් කම්හලක්
2. සංචාරක ව්‍යාපාරයක්
3. මුදල් ආයෝජකයකු
4. පෞද්ගලික අරෝග්‍යශාලාවක්
5. රක්ෂණ සමාගමක්
6. බැංකු හා රක්ෂණ සමාගමක්
7. ඉන්ධන පිරවුම්හලක්
8. දුරකතන මධ්‍යස්ථාන
9. පිඟන් ගඩොල් නිපදවීම හා අලෙවිය
10. වෙන්දේසිකරුවන්
11. තේ කර්මාන්ත ශාලා
12. නියෝජිත තැපැල් කාර්යාල
13. උකස් බඩු ගන්නා ව්‍යාපාර
14. මෝටර් වාහන සර්විස් කිරීම
15. වාහන කොටස් ඒකරාශීකර සවි කිරීම
16. බ්‍රෝකර්වරුන්
17. කොන්ත්‍රාත්කරුවන්
18. සම්ප්‍රේෂණ කුළුණු මගින් දුරකතන සේවා සැපයීම
19. පෞද්ගලික අධ්‍යාපන ආයතනය
20. ජලය හා පිරිපහදු කරන ලද පානීය ජලය බෙදාහැරීම හා අලෙවිය
21. රට හා මෙරට බීම හල්
22. කිරි එකතු කර විකිණීම
23. රියැදුරු පුහුණු ආයතන
(33) දර්ශන කාමර පවත්වාගෙන යාම
(34) දුරකතන සංනිවේදන කුළුණු බලපත්‍ර ගාස්තු
(35) මංගල ශාලා, හෝටල්, නවාතැන්, නිවාස ලැගුම් නිවාස
(36) සිසිල් බීම (වාතික පාන) කර්මාන්ත ශාලා
(37) පුද්ගලික බස් නැවතුම්පළ, බස් ආසන ලියාපදිංචිය ස්ථානය බර වාහන කුළියට ගැනීම
(38) පුද්ගලික බස් නැවතුම් පෙදෙස, කාර්යාලයේ ආසනය
(39) බර වාහන කුළියට ගැනීම (සෑම බර වාහනයක්ම අය කරනු ලැබේ)
(40) ස්වයංක්‍රීය යාන්ත්‍රික මාරු මධ්‍යස්ථානය

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කන්කසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කන්කසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/2

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගෝ ඝාතකාගාර පවත්වාගෙන යාම

ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ ගෝ ඝාතකාගාර විධිමත් කිරීමට නියාමනය කිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා වැනි අරමුණින් 201 වැනි අධිකාරය ගෝ ඝාතක ආඥාපනත සමග 3 වැනි වගන්තියට අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 102 සහ 122(1) යන වගන්ති සමග කියවිය යුතු 126 (ix) (ඒ) යන උපවගන්තිය යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව ගෝ ඝාතකගාරයේ ඝාතනය කරනු ලබන එක් හරකෙකු සඳහා රුපියල් 200 0 ක මුදල බැගින් ගාස්තු අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි).

12-352/3

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වාහන නතර කර තැබීම නියාමනය කිරීම - 2022 වර්ෂය

ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාහන නතර කර තැබීම විධිමත් කිරීම නියාමනය කිරීම පාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම යනාදිය සම්බන්ධයෙන් උතුරු පළාත් සභාවේ සම්මත අතුරු ව්‍යවස්ථාවලට අනුව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්ති සමග කියවිය යුතු 126 හා (vii) (ඌ) යන උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වාහන නතර කර තැබීම සඳහා වන ගාස්තු පහත දැක්වෙන පරිද්දෙන් පනවා මාසිකව අයකරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

(1)	ත්‍රිරෝද රථයක් නවතා තැබීමේ ගාස්තු (එක් මසකට රු. 100 0 බැගින් එක් අවුරුද්දකට)	රු. 1,200 0
(2)	කුඩා ටිපර් (රථයක් නවතා තැබීමේ ගාස්තු (මසකට රු. 100 0 බැගින් එක් අවුරුද්දකට)	රු. 1,200 0
(3)	ලෑන්ඩ් මාස්ටරයක් නවතා තැබීමේ ගාස්තු (මසකට රු. 100 0 බැගින් එක් අවුරුද්දකට)	රු. 1, 200 0

පහත දැක්වෙන ස්ථාන ලියාපදිංචි කළ ත්‍රිරෝද රථ නවතා තැබීමේ ස්ථාන වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත :

1. මල්ලාකම් හංදිය
2. මල්ලාකම් වෙළෙඳ පොළ
3. අධිකරණය ඉදිරිපසින් වල්ලයි සංගානයි පාර
4. දුරක්කයියම්මන් කෝවිලඩි
5. තෙල්ලිප්පලයි රෝහල ඉදිරිපස

6. මලයිවෙම්පඩි වෙළෙඳ පොළ
7. විවිධ සේවා සමුපකාර සමිතිය ඉදිරිපසින් අලවෙඩ්ඩි
8. කේනික්කරයි
9. තවලක්කිරි මුත්තුමාරියම්මන් කෝවිලඩි අලවෙටඩ්
10. වීමන්කාමම් වෙළෙඳ පොළ
11. තෙල්ලිප්පලයි හංදිය
12. වසන්තපුරම් ග්‍රාම නිලධාරි කාර්යාලය ඉදිරිපසින්
13. සිත්තිරමේලි හංදිය
14. ආලඩි ඉලවාලයි
15. කුට්ඩියප්පුලම්
16. පන්නාලයි
17. කීරිමලයි නගුලේෂ්වරම්
18. කොල්ලංකලට්ඩි (මඩත්තඩි)
19. මාවිට්ඩටපුරම් මඩත්තඩි
20. මාවිට්ඩටපුරම් කෝවිලඩි
21. ආවලෙ හංදිය
22. මයිලිඩ්ඩි හංදිය
23. කංකසන්තුරය දුම්රිය ස්ථානය

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලටඩ්),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ දී ය.

12-352/4

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ඉඩම් වෙන්දේසි බද්ද

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන යම් ඉඩමක්, වෙන්දේසිකරුවෙකු හෝ තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයෙකු හෝ අනුයෝජිතයෙකු හෝ විසින් වෙන්දේසියෙන් හෝ වෙනත් අන්‍යාකාරයකින් හෝ විකුණනු ලබන අවස්ථාවක එවැනි විකිණීමෙන් ලත් මුදලින් ප්‍රාදේශීය සභා පනතේ 154 වැනි වගන්තියේ 1 වැනි උපවගන්තිය යටතේ ගෙවිය යුතු සියයට එකකට සමාන බදු මුදල විකුණුම්කරු හෝ වෙන්දේසිකරු හෝ තැරැව්කරු හෝ ඔහුගේ සේවකයා හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ විසින් ගෙවිය යුතුයි. යන්නෙන්, අංක 05/21.10.2021 වැනි දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලට්ඩි),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

12-352/5

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගොඩනැගිලි ඉදි කිරීම සඳහා වන අනුමැතිය හා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වැනි හා 78 වැනි වගන්ති යටතේ සහ අංක 520/7 හා 1988.08.23 දිනැති *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ IV (ආ) කොටසේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් පළ කරන ලද්දා වූ ද අතුරු ව්‍යවස්ථාවල 8 වැනි වගන්තියට අනුකූලව සි 1978 වර්ෂයේ අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතට අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/8 දරන 17.04.2009 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත ගාස්තු වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ අළුතින් ඉදි කිරීමට යෝජිත ගොඩනැගිලිවල ප්‍රාදේශීය සභාවේ අනුමැතිය පරීක්ෂණ ගාස්තුව හා (අනවසර) ගොඩනැගිලි සඳහා වන දඩ මුදල පහත දැක්වෙන උපලේඛන අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

කංකසන්තුරයි (කොල්ලංකලටඩි),
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

1 සංවර්ධන අවසරපත්‍ර නිකුත් කිරීම

i. ගොඩනැගිලි ඉදිකිරීමක්/පවත්නා ගොඩනැගිලි වලට අලුතින් කොටසක් එකතු කිරීමක්/ නැවත ඉදිකිරීමක් සඳහා අවසරපත්‍රයක් නිකුත් කිරීම

(i)

ගෙබිමේ විශාලත්වය වර්ග මීටර් වලින්	*පදිංචිය සඳහා* රු.	*වාණිජ හෝ වෙනත් භාවිත* රු.
45ට අඩු	500 0	1,000 0
45 - 90	1,500 0	2,000 0
91 - 180	2,500 0	3,000 0
181 - 270	3,500 0	4,000 0
271 - 450	4,500 0	6,000 0
451 - 675	5,500 0	8,000 0
676 - 900	6,500 0	10,000 0
901 - 1225	7,500 0	12,000 0
1225 ට වැඩි	7,500 0	12,000 0
ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,000 බැගින්		ව.මී. 1226 ඉක්මවීමෙන් පසු සෑම ව.මී. 90ක් සඳහාම රු. 1,250 බැගින්

ii. මායිම් තාප්පයක් / ආරක්ෂක බැමි ඉදිකිරීමක්

(ii)

	නේවාසික (දික් මීටර් 1ක් සඳහා) රු. ශත	වාණිජ හා වෙනත් වර්ග (දික් මීටර් 1ක් සඳහා) රු. ශත
• ගොඩනැගිලි සීමාවෙන් පිටත	300 0	400 0
• ගොඩනැගිලි සීමා තුළ	500 0	600 0

iii. ඉඩමක් / කුඹුරක් ගොඩ කිරීම

(iii) ව.මී. 150ට අඩු රු. 1,500ක් සහ එයට වැඩි වන සෑම ව.මී. 150ක් සඳහාම රු. 1,000 බැගින්

iv. දුරකථන කුළුණක් / ඇන්ටෙනා කුළුණක් ඉදිරකිරීම

(iv) උස මීටර් 5-20 දක්වා රු. 20,000 ක් සහ එයට වැඩි වන සෑම මීටර් එකකටම රු. 100 බැගින්

v. විශේෂ ව්‍යාපෘති සඳහා සංවර්ධන බලපත්‍රයක් නිකුත් කිරීම

(v)රුපියල් මිලියන 5කට රු. 5,000 ක් සහ එයට වැඩි වන සෑම රුපියල් මිලියන එකකටම රු. 100 බැගින්

2 නේවාසික සඳහා වූ ඒකකයක භාවිතය වෙනස් කිරීම

(i) පෙරසැරි ගාස්තු

ගෙබිම ප්‍රමාණය (වර්ග මීටර්)	*රු.*
45ට අඩු	500 0
45 - 90	1,000 0
91 - 180	1,250 0
181 - 270	1,500 0
271 - 450	1,750 0
451 - 675	2,000 0
676 - 900	2,250 0
900 ට වැඩි	2,250 0

ව.මී. 901කට වැඩි වන සෑම එක් එක් ව.මී. 90ක් සඳහාම රු. 500 බැගින්

3 අනුකූලතා සහතික නිකුත් කිරීම (සෑම ඉදිකිරීමක්, සංවර්ධනයක් සඳහාම අනුකූලතා සහතිකය ලබාගත යුතුය)

අනුකූලතා සහතිකය ප්‍රදානය කිරීමේ ගාස්තු

i. • නේවාසික ඉදිකිරීමක්

• වාණිජ හා වෙනත් ඉදිකිරීමක්

(i) • ව.මී. 300ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1කටම රු. 10 බැගින්

• ව.මී. 100ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1කටම රු. 20 බැගින්

ii. මායිම් තාප්පයක් / ආරක්ෂක බැමි ඉදිකිරීමක්

(ii) පළමු දික් මීටර් 100ක් සඳහා රු. 1,000ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1කටම රු. 10 බැගින්

iii. ඉඩමක් / කුඹුරු ඉඩමක් ගොඩකිරීම

(iii) ව.මී. 150ට අඩු රු. 3,000 ක් සහ ඊට වැඩි වන සෑම ව.මී. 1කටම රු. 20 බැගින්

iv. දුරකථන/විදුලි සංදේශ කුළුණක්

(iv) උස මීටර් 5 සිට 20 දක්වා රු. 2,000 ක් සහ ඊට වැඩි වන සෑම මීටර් 1කටම රු. 100 බැගින්

v. විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක්

	රු.
(v) කුඩා පරිමාණ සඳහා	5,000 0
මධ්‍යම පරිමාණ සඳහා	10,000 0
මහා පරිමාණ සඳහා	20,000 0

4 නිසි සංවර්ධන බලපත්‍රයකින් තොරව ගොඩනැගිලි ඉදිකිරීමක් / කොටස් එකතු කිරීමක් / නැවත ඉදිකිරීමක්

ඉදිකිරීමේ අදියර	*නේවාසික ව.මී. 1 ක් සඳහා ගාස්තු*	*වාණිජ හා වෙනත් ව.මී. 1 ක් සඳහා ගාස්තු*
	රු.	*රු.*
* අත්තිකාරම් වැඩ පමණක් (ලණු මට්ටම) සම්පූර්ණ කොට ඇති විට	200 0	500 0
* වහල මට්ටම දක්වා (වහලය රහිතව) ඉදිකොට ඇතිවිට	300 0	1,000 0
* වහලය ඇතුළුව ඉදිකොට ඇති විට	400 0	1,500 0
* සම්පූර්ණයෙන් ඉදිකොට ඇතිවිට	500 0	2,000 0
ii. මායිම් තාප්පයක් / ආරක්ෂක බැමි ඉදිකිරීමක්	400 0	400 0

	නේවාසික ච.මී. 1 ක් සඳහා ගාස්තු	වාණිජ හා වෙනත් ච.මී. 1 ක් සඳහා ගාස්තු
iii. ඉඩමක් / කුඹුරු ඉඩමක් ගොඩකිරීම	සෑම වර්ග මීටර් 150කටම රු. 5,000 බැගින්	
iv. දුරකථන / විදුලි සංදේශ කුළුණක්	උස සෑම මීටර් 5කටම රු. 10,000 බැගින්	
v. විශේෂ සංවර්ධන ව්‍යාපෘතියක්	සෑම මිලියන 05කටම රු. 10,000 බැගින්	
vi. අනුකූලතා සහතිකය නොමැතිව පදිංචි වීම/ භාවිතා කිරීම හෝ ප්‍රයෝජනයට ගැනීම	එක් දිනකට රු. 50 බැගින්	

12-352/6

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ජාතික පාරිසරික පනත යටතේ වන දැන්වීම

මධ්‍යම පාරිසරික අධිකාරිය 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 28 වැනි වගන්තියට අනුව හා 1988 අංක 56 දරන සංශෝධිත පනතේ විධිවිධාන ප්‍රකාරව මධ්‍යම පාරිසරික සභාපතිවරයා විසින් එකී පනත යටතේ අංක 1159/22 හා 2002.11.22 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ IV වැනි කොටසින් පළ කරන ලද්දාවූද එකී ගාස්තුවලට හා එකී රෙගුලාසිවලට අනුව 2003 වසරේ ජනවාරි මස 01 වැනිද සිට පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති බලතල රාජකාරි හා කර්තව්‍ය ප්‍රාදේශීය සභාවෙහි සභාපතිවරයාට පවරාදීම මත වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ මෙම පනත ක්‍රියාත්මක වන අතර පහත උපලේඛනයෙහි දැක්වෙන කර්මාන්ත සඳහා මධ්‍යම පාරිසරික අධිකාරිය විසින් නියම කර ඇති ආකාරයේ ආකෘතිපත්‍ර ගාස්තුව එකක් සඳහා පරීක්ෂණ ගාස්තු හා බලපත්‍ර ගාස්තු යනාදිය පනවා අය කළ යුතුයි යන්නෙන් අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

ප්‍රාදේශීය සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක ගාස්තුව වශයෙන් රුපියල් 4,000 ක මුදල හා බදු මුදල අයකරනු ලැබේ. එමෙන්ම පරිසර ආරක්ෂණ බලපත්‍රය එක් වරක් (වසර තුනකට වරක්) අළුත් කරන විට පරිසර ආරක්ෂණ බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 4,000 ක මුදල හා බදු මුදල අයකරනු ලැබේ.

පාරිසරික පරීක්ෂණ ගාස්තු යොදවන ලද ප්‍රාග්ධනයට අනුව පහත දැක්වෙන පරිද්දෙන් අය කරනු ලැබේ :

යොදවන ලද ප්‍රාග්ධනය	*පරීක්ෂණ ගාස්තුව* *රු. ශ.*
රු. 2,50,000 වඩා අඩු නම්	3,000 0
රු. 2,51,000 ත් - 5,00,000 අතර නම්	3,750 0
රු. 5,01,000 ත් 10,00,000 අතර නම්	5,000 0
රු. 10,00,000 ට වඩා වැඩි නම්	10,000 0

ප්‍රාදේශීය සභා පනතේ 149, 150, 152 (1) යන වගන්ති යටතේ පනවා අයකර ගන්නා බලපත්‍ර ගාස්තුවලට කිසිදු ආකාරයකින් අගතියක් සිදු නොවේ.

උපලේඛනය

කොටස ''ඇ''

1. සියලුම වාහන ඉන්ධන පිරවුම් හල්
2. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත
3. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන තෙල් සිදීමේ කර්මාන්ත
4. සේවක සංඛ්‍යාව 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් යොදවන මද්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත

5. වියළි ක්‍රියාවලි සහිත වී මෝල්
6. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම්හල්
7. දුම්කොළ වේලීමේ කර්මාන්ත
8. සල්ෆර් දුම් ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 ක් හෝ ඊට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත
9. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත
10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා
11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක්ගල් නිෂ්පාදනය කිරීම කර්මාන්ත
13. දිනකට මෙට්‍රික් ටොන් 20 ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත හුණු පෝරණු
14. සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත
15. සියලුම බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත
16. උළු සහ ගඩොල් කර්මාන්ත
17. පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරන ලබන කැණීම් කටයුතු සඳහා එක් වරකට එක් බෝර වලක්.
18. දිනකට ඝනමීටර් 50 ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත
19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25 ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත
20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20 ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්
21. වාහන අළුත්වැඩියා කිරීමේ /නඩත්තු කිරීමේ කටයුතු සිදු කරන ගරාජ්
22. ශීතකරණ හා වායුසමීකරණ උපකරණ හා පද්ධති අළුත්වැඩියා කිරීමේ නඩත්තු කිරීම සවි කිරීම නිෂ්පාදනය කිරීම යනාදිය සිදු කරන හා නඩත්තු කිරීමේ පහසුකම (ගරාජ ඇතුළුව) ජංගම වායු සමීකරණ හා ප්‍රවාහන ශීතකරණ යන්ත්‍රවල ශීතකාරක ප්‍රතිචක්‍රීකරණය හා ප්‍රතිග්‍රහණය කරන යනාදිය සිදු කරන ස්ථාන
23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලූ පර්යන්ත
24. සේවකයින් 10 ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන සියලුම විදුලි හෝ ඉලෙක්ට්‍රෝනික භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථාන
25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/7

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 වැනි වගන්තියේ (vii) (ඊ) හා (xxx) යන උපවගන්ති යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා පළාත් පාලන නිවාස ඉදිකිරීමේ, අමාත්‍යවරයා විසින් අංක 520/7 හා 1988.08.23 දිනැති *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් (62/, 63/, 64/ පිටුවල) පළ කරන ලද්දා වූ ප්‍රචාරක දැන්වීම, සම්බන්ධයෙන් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ කවර හෝ තැනැත්තෙකු විසින් යම් වීදියක් මත හෝ වීදියේ නෙරා සිටින ආකාරයකින් වැනි ප්‍රචාරක දැන්වීම පුවරු හෝ වෙනත් තාවකාලික ව්‍යුහ හෝ යම් ආකාරයකින් වැනි කුමන හෝ අලංකාරයේ පිහිටීමක් හෝ පිහිටුවීමට කටයුතු කිරීමේ කටයුත්ත සඳහා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව වෙතින් අනුමැතිය ලබාගත යුතුයි. මෙම කරුණ සම්බන්ධයෙන් පහත දැක්වෙන උපලේඛනයට අනුව ප්‍රචාරක දැන්වීම් පුවරුවලට ගාස්තු අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරමි. මෙලෙසින් සිටුවන ස්ථිර ප්‍රචාරක දැන්වීම සෑම වසරක් පාසාම මාර්තු මස 31 වැනි දිනට පෙර නියමිත ගාස්තුව ගෙවා අළුත් කිරීම කළ යුතු බවත් දන්වමි.

(1) එක් වසරකට බිත්තියක් මතින් හෝ නාම පුවරුවක් මතින් ප්‍රදර්ශන කෙරෙන ස්ථිර ප්‍රචාරක දැන්වීමකට - වර්ග අඩියක් සඳහා (දැන්වීමක් නාම පුවරුවක දෙපැත්තෙහිම ප්‍රදර්ශනය කර ඇත්නම් දෙපැත්තටම ගාස්තු අය කෙරේ.) රු. 100 0

(2) එක් වසරකට බැනරයකින් ප්‍රදර්ශනය කෙරෙන තාවකාලික දැන්වීමකට වර්ග අඩියක් සඳහා රු. 50 0

(3) එක් වසරකට පුවරුවක හෝ උපකාරයක සමගින් ප්‍රදර්ශනය කෙරෙන විදුලිපහන් ධාරාව සමගින් වූ දැන්වීමකට - වර්ග අඩියක් සඳහා රු. 200 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-352/8

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (272 වැනි පරිච්ඡේදය)

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශය තුළ ඇති කරන සුනඛයින් සඳහා වැනි ලියාපදිංචිය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148(3.4) වැනි වගන්තියට අනුකූලව එක් සුනඛයෙකුට 2022 වසරට ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 30 0 පනවා අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-352/9

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පාපැදි ලියාපදිංචි කිරීමේ ගාස්තුව සඳහා වන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 (3.4) වැනි වගන්තියට අනුකූලව පාපැදියක් ලියාපදිංචි කිරීමේ ගාස්තුව වශයෙන් රුපියල් 30 0 ක් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-352/10

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කසළ හා ගල් වැලි ගොඩනැගිලි සුන්බුන් ඉවත් කරලීම සඳහා වන ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ හා 1988.08.23 දිනැති *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* 9(4) වැනි වගන්තිය යටතේ සභාවේ බල ප්‍රදේශය තුළ ට්‍රැක්ටර් යන්ත්‍රය මගින් කසළ බැහැර කරලීම සඳහා පහත දැක්වෙන පරිද්දෙන් ගාස්තු අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

(1)	කුණු කසල බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1 ක් සඳහා ගාස්තුව	රු. 1,500 0
(2)	කුකුල් අපද්‍රව්‍ය බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1 ක් සඳහා ගාස්තුව	රු. 2,000 0
(3)	ගල් වැලි ගොඩනැගිලි සුන්බුන් බැහැර කිරීම	ට්‍රැක්ටරය මගින් ලෝඩ් 1ක් සඳහා ගාස්තුව	රු. 4,000 0
(4)	කැඩුණු වීදුරු ''උළු'' බැහැර කිරීම	පොහොර බෑගයක් සඳහා ගාස්තුව	රු 50 0
(5)	වෙළඳ සැළකින් කසළ බැහැර කිරීම	පොහොර බෑගයක් සඳහා ගාස්තුව	රු. 50 0

තේ කඩවලින් සහ භෝජනාගාරවලින් එක් වර්ගයකට අනුව කසළ බැහැර කිරීම පිණිස පහත දැක්වෙන පරිද්දෙන් මාසිකව ගාස්තුව අය කරනු ලැබේ.

සාමාන්‍ය කසළ බැහැර කිරීම සඳහා මාසික ගාස්තුව - ව්‍යාපාරික ස්ථානවලින්, තේ කඩවලින් සහ භෝජනාගාරවලින් එක් වර්ගයට අනුව අනුපිළිවෙලින් රු. 200, රු. 500

ප්ලාස්ටික්, පොලිතීන්, ඛනිජමය වැනි කසල බැහැර කිරීම සඳහා මාසික ගාස්තුව - ව්‍යාපාරික ස්ථානවලින්, තේ කඩවලින් සහ භෝජනාගාර වලින් එකී වර්ගයට අනුව අනුපිළිවෙලින් රු. 5,000, රු. 7,500, රු. 10,000.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/11

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගල්, බොරළු, පස්, වැලි, ගොඩනැගිලි සුන්බුන් මත ගාස්තුව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශී සභාවේ බල ප්‍රදේශය තුළ ගල්, බොරළු, පස්, වැලි, ගොඩනැගිලි සුන්බුන් යනාදිය බර වාහනවලින් ගෙනයාම සඳහා වන ගාස්තුව කියුබ් එකකට රුපියල් 200 0 ක් බැගින් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/12

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ගලී බවුසර් සේවා ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව මගින් ගලී බවුසරයෙන් සේවා සැපයීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන පරිදි ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

සභාවෙහි බල සීමාව තුළ පළමුවෙනි ලෝඩය සඳහා	රු. 6,000 0
ඊළඟ සෑම ලෝඩ් එකක් සඳහාම	රු. 5,000 0
සභාවෙහි බලසීමාවට පිටින් නම් පළමුවෙනි ලෝඩය සඳහා	රු. 7,500 0
ඊළඟ සෑම ලෝඩ් එකක් සඳහාම	රු. 5,000 0

සභාවෙහි බලසීමාවට පිටින් වන සේවය සඳහා ඉහත ගාස්තුව සමගින් අතිරේක සෑම කිලෝමීටරයක් සඳහාම රුපියල් 100 0 බැගින් අයකරනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/13

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

බවුසරය මගින් ජලය සැපයීම සඳහා සේවා ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 114 වැනි හා 118 වැනි වගන්ති යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව මගින් පානීය ජලය සැපයීමේ සේවාව සඳහා අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

ජල ටැංකියක් තබා පානීය ජලය සැපයීමට :

ජල ටැංකියක් සඳහා කුලී ගාස්තුව	රු. 1,000 0
ජල බවුසර් ටැංකියක් සඳහා කුලී ගාස්තුව	රු. 1,500 0
පානීය ජලය ලීටර් එක (1) ක් සඳහා ගාස්තුව	රු. 1 0
පානීය ජලය ලීටර් එක (1)ක් සඳහා ගාස්තුව	රු. 2 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/14

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

රෝලර් මැෂින් යන්ත්‍රයක් සඳහා කුළිය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් රෝලර් යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

එක් පැයක් සඳහා රුපියල් 2,500 0 කි. පැය 2 කට වඩා අඩුවෙන් එක් දවසකට වැඩ කිරීමට හැකියි. පැය 2 කට වඩා අඩු වූ අවශ්‍යතාවයක් සඳහා ගාස්තුව රුපියල් 5,000 0 කි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/15

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුළියට ලබාදීමේ ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම්, උතුරු ප්‍රාදේශීය සභාව විසින් මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 05/21.10.2021 දින සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

එක් පැයක් සඳහා රුපියල් 4,750 0 කි (ගමන් ගාස්තුව ඇතුළුව)
ගමන් ගාස්තුව - පැයක කුලී ගාස්තුවෙන් 50% ක් වේ.
(දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිළ ගණන් අනුව ගාස්තු අයකිරීම වෙනස් වේ.)

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/16

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව

JCB (බැකෝ) යන්ත්‍රයක් සඳහා කුළී ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව විසින් බැකෝ යන්ත්‍රයෙන් සේවා සැපයීම සඳහා අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එක් පැයක් සඳහා රුපියල් 3,000 කි. (ගමන් ගාස්තුව ඇතුළුව.)
ගමන් ගාස්තුව - පැයක කුළී ගාස්තුවෙන් 50% ක් වේ.
(දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මිළ ගණන් අනුව ගාස්තු අයකිරීම වෙනස් වේ.)

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/17

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීම සඳහා අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අයකර ගැනීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

	රු. ශත
නිර්මාණ ශිල්පි ලියාපදිංචි කිරීම සඳහා බලපත්‍ර ගාස්තුව	1,000 0
නිර්මාණ ශිල්පි ලියාපදිංචි කිරීමේ ගාස්තුව	2,000 0
අළුත් කිරීමේ ගාස්තුව	1,000 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/18

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

ආකෘති පත්‍ර ගාස්තු සහතිකපත් ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ ආකෘති පත්‍ර ගාස්තු/සහතික පත් ගාස්තු යනාදිය පහත දැක්වෙන පරිදි අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව පහත දැක්වෙන ගාස්තු අය කිරීමට තීරණය කර ඇති බව මෙයින් දන්වමි :

ආකෘති පත්‍ර ගාස්තු :		රු. ශත
1.	ගොඩනැගිලි අයදුම්පතක් සඳහා	500 0
2.	දේපළ නාමය මාරු කිරීමේ අයදුම් පතක් සඳහා	300 0
3.	ව්‍යාපාරික බලපත්‍ර අයදුම්පතක් සඳහා	100 0
4.	පාරිසරික අයදුම්පතක් සඳහා	200 0
5.	පුස්තකාල සාමාජික අයදුම්පතක් සඳහා	20 0

සහතිකපත් ගාස්තු :		
1.	දේපළෙහි හිමිකම් සහතිකයක් සඳහා	1,000 0
2.	වීටීරේඛා සහතිකයක් සඳහා	1,000 0
3.	නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා	1,000 0
	ගොඩනැගිලි අයදුම්පත් කාලය දීර්ඝ කිරීමේ ගාස්තු	500 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/19

වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නාමය මාරු කිරීම සඳහා වන පරීක්ෂණ ගාස්තුව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ දේපළෙහි නාමය මාරු කිරීම සඳහා පරීක්ෂණ ගාස්තුව වශයෙන් රුපියල් 300 0 ක් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/20

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

එළවළු විකිණීම - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 126 (ix) ඒ වැනි වගන්තිය යටතේ හා 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසින් පළ කරන ලද්දාවූ ද පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල II වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරා දී ඇති බලතල අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම්'' උතුරු ප්‍රාදේශීය සභාවේ'' බල ප්‍රදේශය ඇතුළත පොදු වෙළඳ පොළ පිහිටා ඇති ස්ථානයේ සිට කිලෝමීටර් එකක (01) ක වටරවුම තුළ ව්‍යාපාරික ස්ථාන'' සංචාරක වෙළෙඳාම සහ පදික වෙළඳාම ආදියෙන් එළවළු විකිණීම හෝ ප්‍රදර්ශනයට තැබීම හෝ සම්පූර්ණ-යෙන්ම තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/21

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

තොටුපළ සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(2) වැනි වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ දකින්නට ලැබෙන මයිලිටඩ් හා කංකසන්තුරයි යන තොටුපළවලින් ආනයනය කරනු ලබන භාණ්ඩවල වටිනාකමින් 0.1% ක ගාස්තුවක් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/22

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

බනිජ තෙල් සංස්ථාවෙන් ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149(2) වැනි වගන්තිය යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වූ කංකසන්තුරයි ප්‍රදේශයේ පිහිටා ඇති බනිජ තෙල් සංස්ථාවේ ගබඩාවෙහි ඉතුරුම් කර ඇති බනිජ නිෂ්පාදිත වටිනාකමින් 0.05% ක් ගාස්තු වශයෙන් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/23

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වාසනා ලොතරැයිය දිනුම් ඇදීම සඳහා වන ගාස්තුව

1987 අංක 37 දරන විනෝද බදු සංශෝධන පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසනා ලොතරැයිය දිනුම් ඇදීමේ කටයුතු සිදුකරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 1,000 0 ක මුදලක් ගෙවිය යුතුයි සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම් බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් 1,000 0 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම් බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 10% ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 05/21.10.2021 දරන සභාවේ පරිපාලන නියෝගයට අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/24

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

වරිපනම් බදු මුදල අයකර ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වැනි වගන්තියට අනුකූලව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පෙර වසරේ අයකිරීම් කළ පරිද්දෙන් දේපළ මත බදු මුදල සහ දඩ මුදල අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/25

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් සඳහා වන ගාස්තුව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පාපැදි ආරක්ෂාකාරී ස්ථානයක් නඩත්තු කරන්නන් විසින් බලපත්‍ර ගාස්තුව වශයෙන් රුපියල් 1,000 0 ක මුදලක් ගෙවිය යුතුයි. සභාව විසින් ප්‍රජා සංවර්ධන ආයතන සඳහා බදු මුදලින් නිදහස් කර ඇත්නම් බලපත්‍ර ගාස්තු වශයෙන් රුපියල් 1,000 0 ක මුදල පමණක් අයකර ගැනීමට හා බදු මුදලින් නිදහස් නොකර ඇත්නම් බලපත්‍ර ගාස්තුව සමගින් කුවිතාන්සිවල වටිනාකමින් 10% ක මුදල ගාස්තුව වශයෙන් අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/26

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

නළ ළිං ඉදිකිරීම සඳහා වන අනුමැතිය

යාපනය ජාතික ජල සැපයීම් හා ජලාපවහන මණ්ඩලයේ නල ළිං ඉදි කිරීමේ ක්‍රියාපටිපාටියට අනුව හා අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ නල ළිං ඉදි කරනු ලබන්නේ නම් ප්‍රාදේශීය සභාවෙන් පූර්වාංග අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කළ යුතු යැයි මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-352/27

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කුකුල් මස් විකිණීම සඳහා වන දැන්වීම

ගෝ ඝාතක ආඥාපනතේ 201 වැනි අධිකාරය සමග 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුකූලව ප්‍රාදේශීය සභාවේ, බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පිරිසිදුභාවය හා සෞඛ්‍යය ආරක්ෂා වන අරමුණින් හා එකී පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (සං) (එ) යන වගන්තිය යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) වැනි කොටසින් පළ කරන ලද්ද, වූ පළාත් පාලන ආයතන සඳහා වන අතුරු ව්‍යවස්ථාවල IV වැනි පරිච්ඡේදයේ ප්‍රසිද්ධ වෙළෙඳ පොළ අතුරු ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ පළාත් පාලන ආයතන වෙත පවරන ලද බලතල ප්‍රකාරව හා වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ, අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පොදු වෙළෙඳ පොළවල් පිහිටා ඇති ස්ථාන (මල්ලාකම පොදු වෙළෙඳ පොළ, වීමන්කාම පොදු වෙළෙඳ පොළ, කුත්තන් වීමා වෙළෙඳ පොළ, පන්නාලයි, ඉරාල්මඩම් වෙළෙඳපොළ, අලවෙට්ඩි උතුරු වෙළෙඳ පොළ) වල සිට කිලෝමීටර් එක (01) ක වටරවුම තුළ කුකුල් මස් විකිණීම හෝ පාරිභෝගිකයින්ට කුකුළන් සජීව වෙන් වෙන්ව විකිණීම හෝ තහනම් කර ඇති බව මෙයින් දන්වමි.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩි).

12-352/28

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයේ අයකර ගැනීමට හැකි ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ පිහිටා ඇති කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයෙහි පහත දක්වා ඇති පරිදි ගාස්තු අයකර ගැනීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

කීරිමලයි පොකුණ පිහිටා ඇති ස්ථානයේ :

වැසිකිළි කැසිකිළි පාවිච්චිය සඳහා වන ගාස්තුව (ස්ත්‍රී/පුරුෂ)	රු. 10 0
පිරිසිඳු වතුරින් නෑම සඳහා වන ගාස්තුව ස්ත්‍රී/පුරුෂ	රු. 30 0
ආරක්ෂක භාණ්ඩ පෙට්ටියක් සඳහා වන ගාස්තු	රු. 30 0

වාහන නතර කර තැබීම සඳහා වන ගාස්තු :

පාපැදි සඳහා	රු. 10 0
යතුරු පැදියක් සඳහා	රු. 20 0
ත්‍රීරෝද රථයක්/කාර් රථයක් සඳහා	රු. 30 0
වෑන් වාහනයක් සඳහා	රු. 50 0
මිනි බස් රථයක්/බස් රථයක් සඳහා	රු. 100 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/29

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කීරිමලයි සංචාරක කේන්ද්‍රස්ථානයේ පිහිටියා වූ පොකුණෙහි දිය නෑමට අයකළ හැකි ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ පිහිටියා වූ සංචාරක කේන්ද්‍රස්ථානය වන කීරිමලයි පොකුණෙහි දිය නෑම පිණිස පහත දැක්වෙන පරිදි ගාස්තු අය කිරීමටත් පාසල් සිසුන් ප්‍රාදේශීය සභාව වෙතින් පූර්වාංග අනුමැතිය ලබා ගතයුතු බවත් ජූලි මස අමාවක හා සිවරාත්‍රී දිනවලට නොමිලේ දිය නෑම අනුමත කරන බවත් අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

වැඩිහිටි පුද්ගලයෙකු සඳහා	රු 20 0
බාලවයස්කාර පුද්ගලයෙකු සඳහා	රු. 10 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/30

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

හින්දු සුසානභූමිවල මෘතදේහ ආදාහන කිරීමට ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තිය සමග කියවිය යුතු 126 (iv)(ඇ) සහ (සං) (එ) වැනි වගන්ති යටතේ සුසානභූමි හා මිනීපිටි ආඥාපනත යටතේ ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇත්තා වූ බලතල ප්‍රකාරව, වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවට ඇතුළත් හින්දු සුසානභූමිවල මෘතදේහ ආදාහන කිරීමට හෝ මිහිදන් කිරීමට හෝ සතුන් වැළලීමට ගාස්තු වශයෙන් එක් මෘතදේහයකට හෝ එක් සත්වයෙකුට රුපියල් 1000 0 ක් බැගින් අය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/31

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

පොදු දැක්ම ශාලාව කුළියට දීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය හා සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ සීමාව තුළ කුරුම්පසිටඩ් ප්‍රදේශයේ පිහිටියා වූ සභාවට අයිති පොදු දැක්ම ශාලාවෙහි කුළී ගාස්තු පහත දැක්වෙන පරිදි අය කරනු ලබන බව අංක 05/21.10.2021 වැනි දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

1.	සමාජ සේවා සංවිධානයක් සඳහා එක් දවසකට (පැය 08 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව (විදුලි ගාස්තුව රු. 400 0 ක් ඇතුළත්ව)	රු. 2,400 0
2.	සමාජ සේවා සංවිධානයක් සඳහා අඩ දවසකට (පැය 04 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව (විදුලි ගාස්තුව රු. 200 0 ක් ඇතුළත්ව)	රු. 1,200 0
3.	මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා එක් දවසකට (පැය 08 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව	රු. 5,000 0
4.	මහජන මංගල උත්සවයක් පැවැත්වීම සඳහා දවසකට (පැය 04 ක්) පාවිච්චි කිරීමේ ගාස්තුව	රු. 3,000 0
5.	රාජ්‍ය ආයතන හා පාසල් ගාස්තු අයකිරීමෙන් තොරව ශාලාව පාවිච්චි කළ හැකිය. විදුලි ගාස්තුව එක් දවසකට රු. 400 0 අඩ දවසකට රු. 200 0	

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/32

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

කංකසන්තුරෙ ළමා උද්‍යානයට ඇතුල්වීමේ ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශය තුළ වාසය කරන මහජනයාගේ පවිත්‍රතාවය සහ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ අරමුණින් වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ කංකසන්තුරෙ ළමා උද්‍යානයට ඇතුල්වීමේ ගාස්තු අයකිරීමත් අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව තීරණය කර ඇති බව දන්වමි.

වැඩිහිටි පුද්ගලයෙකු සඳහා	රු. 20 0
බාලවයස්කාර පුද්ගලයෙකු සඳහා	රු. 10 0

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/33

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව - කංකසන්තුරය

අතිශෝක්තියෙන් යුතු සිදුවීම් අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වැනි වගන්තියට අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ ප්‍රාදේශීය සභාවට මායිම් සීමාව තුල අතිශෝක්තියෙන් යුතු සිදුවීම් ගාස්තු 10% අයකිරීමට අංක 05/21.10.2021 දිනට සභාවේ යෝජනාව අනුව දැනුම් දෙනු ලැබේ.

එස්. සුකීර්තන්,
සභාපති,
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි.

වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,
කංකසන්තුරයි (කොල්ලංකලටඩ්).

12-352/34

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂයට බලපත්‍ර ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වැනි වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ හෝ ඒ පනතේ විධිවිධාන යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවෙහි නිරූපිත යම් කාර්යයක් සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ දී නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් පනවා අයකළ යුතු යැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

2022 වර්ෂයට වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකිරීම

I වැනි තීරුව	*II වැනි තීරුව*		
ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
02. හෝටලයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
03. බත් කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
04. ආපනශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
05. තේ කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
06. කෝපි කඩයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
07. බේකරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
08. කිරි පට්ටියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
09. කිරි විකිණීම	500 0	750 0	1,000 0
10. මාළු විකිණීම	500 0	750 0	1,000 0
11. මස් විකිණීම	500 0	750 0	1,000 0
12. සිසිල්බීම කර්මාන්තශාලාවක් පවත්වාගෙන යාම	500 0	700 0	1,000 0
13. ලොන්ඩරියක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

I වැනි තීරුව	*II වැනි තීරුව*		
ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
14. ගවගාලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
15. පෞද්ගලික වෙළෙඳපොලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
16. කොණ්ඩා කැපීමේ සැළුන්හලක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
17. බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
18. ගෝඝාතක ස්ථානයක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0
19. අයිස් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම	500 0	750 0	1,000 0

එසේ වුව ද යම් පරිශ්‍රයක් හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන් පොළක කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන්නා වුවද 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා එම හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන්පොළ ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තාවූ ද අනුමත කර හෝ පිළිගත්තා වූ ද අවස්ථාවක බලපත්‍ර ගාස්තු 2022 වර්ෂයේ ඒ හෝටලයේ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි ආදායමෙන් 1%ක් විය යුතු ය.

12-85/1

———————————————————

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂයට කර්මාන්ත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (1) වැනි උප උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත යම් පරිශ්‍රයක් පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත සෑම කර්මාන්තයක් සම්බන්ධයෙන් මෙම උපලේඛනයේ II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත ප්‍රමාණයේ බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

2022 වර්ෂයට කර්මාන්ත බදු අය කිරීම

I වැනි තීරුව *කර්මාන්තයේ ස්වභාවය*	*II වැනි තීරුව* *පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 500 සීමාව)	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අය කිරීම රු. 750 සීමාව)*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අය කිරීම රු. 1,000 සීමාව)*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. සම් භාණ්ඩ අලුත්වැඩියාව	500 0	750 0	1,000 0
02. ටේලර් සාප්පු	500 0	750 0	1,000 0
03. වින්කලය	500 0	750 0	1,000 0
04. සබන් නිෂ්පාදන	500 0	750 0	1,000 0
05. පපඩම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
06. යෝගට් නිෂ්පාදන	500 0	750 0	1,000 0
07. නූඩ්ල්ස් නිෂ්පාදන	500 0	750 0	1,000 0
08. ගඩොල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
09. කොහු ඉදල් ලණු නිෂ්පාදන	500 0	750 0	1,000 0
10. බෑග් නිෂ්පාදන	500 0	750 0	1,000 0
11. අයිස්ක්‍රීම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
12. කුළු බඩු නිෂ්පාදන	500 0	750 0	1,000 0
13. රස කැවිලි, නිෂ්පාදන	500 0	750 0	1,000 0
14. නිමි ඇඳුම් නිෂ්පාදන	500 0	750 0	1,000 0
15. සම් භාණ්ඩ නිෂ්පාදන	500 0	750 0	1,000 0
16. බිම් මල් නිෂ්පාදන	500 0	750 0	1,000 0
17. වඩු මඩුව	500 0	750 0	1,000 0
18. හඳුන්කුරු නිෂ්පාදනය	500 0	750 0	1,000 0
19. තේ කුඩු නිෂ්පාදන	500 0	750 0	1,000 0
20. කිරි ආශ්‍රිත නිෂ්පාදන	500 0	750 0	1,000 0

12-85/2

———————————————————

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂයට අන්තරාදායක ව්‍යාපාර හා අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 147 වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහා සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 වගන්තිවලින් සැලසී ඇති ප්‍රතිපාදන අනුව පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් 1988.08.23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 520/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ අංක 21 දරන අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව අනුව පහත සඳහන් ව්‍යාපාර අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර වශයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමා ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

උපලේඛනය

2022 වර්ෂයට අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර සඳහා ගාස්තු අය කිරීම

I වැනි තීරුව	*II වැනි තීරුව*		
ස්වභාවය	*පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම*		
	රු. 750 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අය කිරීම රු. 500 සීමාව)	*රු. 750 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක (වාර්ෂික අය කිරීම රු. 750 සීමාව)*	*රු. 1,500 ඉක්මවන අවස්ථාවක (වාර්ෂික අයකිරීම රු. 1,000 සීමාව)*
	රු. ශත	*රු. ශත*	*රු. ශත*
01. ඉන්ධන පිරවුම්හල්	500 0	750 0	1,000 0
02. පොල්ලෙලි වලවල් කර්මාන්ත	500 0	750 0	1,000 0
03. කෘමිනාශක නිෂ්පාදනය	500 0	750 0	1,000 0
04. පෑස්සුම් ස්ථාන	500 0	750 0	1,000 0
05. වෙඩි බෙහෙත් ගබඩා කරන ස්ථාන	500 0	750 0	1,000 0
06. ගෑස් සිලින්ඩර ගබඩා කිරීම හා විකිණීම	500 0	750 0	1,000 0

12 - 85/3

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බද්ද පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 147 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර, සාමාන්‍යයෙන් ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුළ ඇති හෝ පාවිච්චි කරනු ලබන්නා වූ සෑම වාහනයක් හා සතෙක් වෙනුවෙන් මෙහි උපලේඛනයේ සඳහන් අනු ප්‍රමාණය අනුව වූ වාර්ෂික බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පැවති මහ සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

උපලේඛනය

2022 වර්ෂයට වාහන හා සත්ත්ව බද්ද පැනවීම සඳහා ගාස්තු අයකිරීම

වාහන හා සත්ත්ව බද්ද	*රු. ශත*
මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක්	25 0
මෝටර් ලොරියක්, රික්ෂෝවක් කරත්තයක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම	
සෑම බයිසිකලයක් හෝ කරත්තයක් සඳහා	
කරත්තයක් සඳහා -	
(*අ*) වෙළෙඳ කාර්යයන් සඳහා යොදවන්නේ නම්	18 0
(*ආ*) වෙළෙඳ කාර්යයන් සඳහා නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් පා පැදි බලපත්‍ර ලියාපදිංචි කිරීමේ සේවා ගාස්තුව	4 0
සෑම කරත්තයක් සඳහා	20 0
සෑම අත් ට්‍රැක්ටරයක් සඳහා	10 0
සෑම රික්ෂෝවක් සඳහා	7 50
සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ එළුවෙකු සඳහා	15 0
සෑම ඇතෙකු සඳහා	50 0

12-85/4

———————————————————

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද ප්‍රාදේශීය සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී පනතේ හෝ ඒ යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ 150 වැනි වගන්තිය යටතේ යම් බද්දක් ගෙවීම අවශ්‍ය නොවන්නා වූ යම් ව්‍යාපාරයක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේ දී පවත්වාගෙන යන සෑම තැනැත්තෙකුගෙන් ම එම ව්‍යාපාරය 2021 වර්ෂයේ ආදායම මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුළත පවත්නා අවස්ථාවක එහි II වැනි තීරුවේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණය අනුව බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

උපලේඛනය

2022 වර්ෂයට ව්‍යාපාරික බදු අයකිරීම

I වැනි තීරුව	*II වැනි තීරුව*
2021 වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම	*අයකරනු ලබන මුදල රු. ශත*
රු. 6,000 0 නොඉක්මවන අවස්ථාවක	කිසිවක් නැත
රු. 6,000 0 ඉක්මවන එහෙත් රු. 12,000 0 නොඉක්මවන අවස්ථාවක	90 0
රු. 12,000 0 ඉක්මවන එහෙත් රු. 18,750 0 නොඉක්මවන අවස්ථාවක	180 0
රු. 18,750 0 ඉක්මවන එහෙත් රු. 75,000 0 නොඉක්මවන අවස්ථාවක	360 0
රු. 75,000 0 ඉක්මවන එහෙත් රු. 1,50,000 0 නොඉක්මවන අවස්ථාවක	1,200 0
රු. 1,50,000 0 ඉක්මවන අවස්ථාවක	3,000 0

ඉහත උපලේඛනයේ සඳහන් පළමු වැනි තීරුවේ 2021 වර්ෂයේ ව්‍යාපාර ආදායමට II වැනි තීරුවේ සඳහන් අය කිරීම මත වාර්ෂික වෙළෙඳ බලපත්‍ර ගාස්තු හා කර්මාන්ත බදු උපලේඛනයේ සඳහන් ව්‍යාපාර හැර සෙසු සියලු ව්‍යාපාර, ව්‍යාපාර බද්දට 2022 වර්ෂය වෙනුවෙන් ඒ ඒ ආදායම මත ඒ ඒ අය කිරීමට යටත් වන්නේ ය.

12-85/5

———————————————————

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂයට විනෝද බදු පැනවීම

1984 අංක 27 දරන විනෝද බදු (සංශෝධිත) පනතින් සංශෝධිත 1964 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත සියලු විනෝද කටයුතු සඳහා අයකරනු ලබන ඇතුල්වීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරීමට 1964 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය කිරීමට 2022 වර්ෂය සඳහා පනවා අයකළ යුතු යැයි 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

12-85/6

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂයට ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම

ප්‍රචාරක දැන්වීම් පුවරු/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු - 2022

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(1) වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 1988.08.23 වැනි දින අංක 520/07 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන, නිවාස හා ඉදි කිරීම් ගරු අමාත්‍යතුමා අනුමත කර ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට/පාරකට/ ඇළකට/මුහුදට හෝ අහසට පෙනෙන පරිදි වර්ග අඩියකට නොඅඩු දැන්වීමක් හෝ ඉදිකිරීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ප්‍රචාරක පුවරු දැන්වීම් ගාස්තු අය කිරීමට 2022 වර්ෂය සඳහා පනවා අය කළ යුතු යැයි 2021 ඔක්තෝබර් මස 22 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ තීරණ අංක ඉ (103) යටතේ ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

උපලේඛනය

දැන්වීම් පුවරු	I. ඩිජිටල් දැන්වීම් පුවරු (ව.මී 1 කට)	රු. 2,500 0
	II. ඩිජිටල් නොවන දැන්වීම් පුවරු (ව.මී 1 කට)	රු. 1,500 0
	III. නාම පුවරු (ව.මී 1 කට)	රු. 500 0
	IV. මාර්ගයට ඉහළින් මාර්ගය හරහා පවතින දැන්වීම් පුවරු (Gentries) (ව.මී 1 කට)	රු. 1,000 0

12-85/7

———————————————————

නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව - විජයපුර

2022 වර්ෂය සඳහා ගාස්තු පනවා අයකිරීම

2022 වර්ෂයට නව ගාස්තු උපලේඛනයේ සඳහන් පරිදි අය කිරීම නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර 2021 ඔක්තෝබර් මස 20 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ(103) යටතේ යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි. ගරු සභාපති එස්. බී. කුමාරදාස මැතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී කේ. ඒ. ශාන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

එස්. බී. කුමාරදාස,
සභාපති,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින,
නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව,
විජයපුර,
අනුරාධපුර.

2022 වර්ෂයට නව ගාස්තු උපලේඛනයේ සඳහන් පරිදි

		රු. ශත
01.	ත්‍රිරෝද රථ කුළී -වාර්ෂික	250 0
02.	අනුකූලතා අයදුම්පත්‍ර ගාස්තු	300 0
03.	අනුකූලතා පරීක්ෂණ ගාස්තු	1,000 0
04.	අනුබෙදුම්/මිනින්දෝරු අයදුම්පත්‍ර ගාස්තු	300 0
05.	අනුබෙදුම්/මිනින්දෝරු පරීක්ෂණ ගාස්තු	1,000 0
06.	ගොඩනැගිලි සැලසුම් අයදුම් පත්‍ර ගාස්තුව	500 0
07.	ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු	1,000 0
08.	ගොඩනැගිලි සැලසුම් අලුත් කිරීම ගාස්තුව	500 0
09.	දීර්ඝ කාලීන බදු බලපත්‍ර අනුමත ගාස්තුව	600 0
10.	එම පරීක්ෂණ ගාස්තුව	400 0
11.	වීථි රේඛා හා නොපරවා ගැනීමේ අනුමත ගාස්තු	1,000 0
12.	එම පරීක්ෂණ ගාස්තු	400 0
13.	ව්‍යාපාර ලියාපදිංචි නිර්දේශිත ගාස්තුව	400 0
14.	ව්‍යාපාර ලියාපදංචි පරීක්ෂණ ගාස්තු (ස්ථානීය පරීක්ෂාව)	400 0
15.	සභාව සතු භූමිය කටයුත්තකට ලබාදීම සඳහා ගාස්තුව දිනකට	500 0
16.	සුසාන භූමි ගාස්තුව - ආදාහන හා භූමිදාන (සාමාන්‍ය)	500 0
17.	සුසාන භූමි ගාස්තුව - තැන්පත් කිරීම සඳහා වර්ග අඩි 1කට	100 0
18.	සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව	1,000 0
19.	එම අයදුම්පත්‍රය සඳහා	500 0
20.	ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල බොරළු ප්‍රවාහනය සඳහා ගාස්තු අය කිරීම (කියුබ් එකකට)	100 0
21.	වැලි කැණීම්, බොරළු කැණීම්, පස් කැණීම් නිර්දේශය ලබා දීමේ ගාස්තුව	2,000 0
22.	නළ ළිං තැන්පත් මුදල (එක් වර්ෂයකට)	200 0
23.	ජී. අයි බට එකක් එක් දිනක් සඳහා	20 0
24.	පුද්ගලික ජල සැපයුම් සඳහා මාර්ග පළුදු කිරීම් ගාස්තු (බොරළු)	1,000 0
25.	පුද්ගලික ජල සැපයුම් සඳහා මාර්ග පළුදු කිරීම් තාර /කොන්ක්‍රීට් හා ඉන්ටර්ලොක් මාර්ග හරහා ජල සැපයුම් ලබා ගැනීම	3,500 0
26.	පුස්තකාල ඇප තැන්පත් මුදල	50 0
27.	අතුරුවැල්ල සති පොල එක් වෙළෙඳ කුටියක් සඳහා	100 0
28.	කොම්පෝස්ට් පොහොර අලෙවිය සිල්ලර මිල එක් කිලෝවකට	10 0
29.	ට්‍රැක්ටර් ජල බවුසරය එක් දිනක් සඳහා (ජලය නොමැතිව)	6,000 0
	I. එක් ජල බවුසරයක් සඳහා ප්‍රාදේශීය සභා භූමියේ සිට කිලෝමීටර් අටක් ඇතුළත (ජලය නොමැතිව)	1,500 0
	II. එක් ජල බවුසරයක් සඳහා ප්‍රාදේශීය සභා භූමියේ සිට කිලෝමීටර් අටක් ඇතුළත (ජලය සහිතව)	2,000 0
	III. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා	35 0
30.	ට්‍රැක්ටරය ටේලර් වැඩ එක් දිනක් සඳහා	5,000 0
31.	කොන්ක්‍රීට් පරීක්ෂණ කුට්ටි (මොල්ඩ්) එක් දිනකට කුලියට ලබාදීම	1,500 0

		රු. ශත
32.	ට්‍රැක්ටරය ගලී බවුසරය	
(i)	පළමු ගමන් වාරය සඳහා	5,846 0
(ii)	සේවක දිරි දීමනා	400 0
(iii)	දෙවන ගමන් වාරය සඳහා	5,346 0
(iv)	සේවක දිරි දීමනා	400 0
(v)	තෙවන ගමන් වාරය සඳහා	4,846 0
(vi)	සේවක දිරි දීමනා	400 0
(vii)	ඉන් පසු සෑම ගමන් වාරයක් සඳහාම රු. 4,846 0 බැගින් අය කෙරේ.	
(viii)	එම කාර්යය වෙනුවෙන් කාර්යාලයේ සිට අදාල ස්ථානයට යෑම් ඊම් වෙනුවෙන් එක් කිලෝ මීටරයකට රු. 35 0 බැගින් අය කෙරේ.	
33.	බැකෝ ලෝඩර් යන්ත්‍රය කුළියට ලබා දීම මීටර් පැයක් සඳහා ගාස්තුව	3,000 0
34.	කොන්ත්‍රාත් සමිති ලියාපදිංචි කිරීමේ ගාස්තුව	1,000 0
35.	එක් කර්මාන්තයක් සඳහා අයදුම්පත්‍ර ගාස්තුව	500 0
36.	ටිපර් රථය (කියුබ් 2.75) දිනකට පැය 06ක් ඉන්ධන සහිතව ලබා දීම සඳහා (ධාවන දුර කි.මී. 75 ඇතුලත)	15,000 0
	I. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා	150 0
	II. ටිපර් රථය (කියුබ් 2.75) කි.මී. 5 ඇතුලත එක් ගමන් වාරයක් සඳහා	2,500 0
	III. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා	150 0
37.	කෘ කැබ් රථය ආරම්භක ගාස්තුව කි.මී. 5 ක් ඇතුළත එක් ගමන් වාරයක් සඳහා	1,500 0
	I. එම දුර ප්‍රමාණය ඉක්මවන විට එක් කිලෝමීටරයක් සඳහා	35 0
38.	සංචාරක වෙළෙඳාම (බල ප්‍රදේශයේ මාර්ග වල සංචාරක වෙළඳාම් ව්‍යාපාර කටයුතුවල නිරත ව්‍යාපාරිකයින්ගෙන් ගාස්තු අයකිරීම	3,000 0
39.	තුරුලිය සෙවන නිවාඩු නිකේතනය	
	I. වායු සමීකරණ කල කාමර දිනක	1,800 0
	II. සාමාන්‍ය කාමර දිනකට	1,200 0
	ඉහත සේවාවන් සඳහා 10% ක සේවා ගාස්තුවක් අයකරනු ලැබේ.	
40.	ජයබිම උත්සව ශාලාව :	
